**ශීර්ෂය 140 - කඳුරට නව ගම්මාන යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

---

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමු වන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශය, කඳුරට නව ගම්මාන යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුමෙන් හා සැසඳුම් ප්‍රකාශයෙන් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සාමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

## 1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම

---

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයිම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරිම මෙන්ම රජයේ සියලුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරිම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට ආදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන විෂය පථය

---

ශීර්ෂය 140 කඳුරට නව ගම්මාන යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලැසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනිම, නීති,රීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2018 ඔක්තෝබර් මස 18 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනිම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලැසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරිම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 විගණන නිරීක්ෂණය

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කඳුරට නව ගම්මාන යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශයේ සිදු කරන ලද විගණනයේදී අනාවරණය වු විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.21 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 127 හා 128 හි සඳහන් විධිවිධාන ඉටුකිරීමේදී අනාවරණය වු පහත සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටුකර තිබුණු බව නිරීක්ෂණය විය.

| මුදල් රෙගුලාසි **127** ප්‍රකාර ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරිගේ එම විධිවිධානයට අනුගත වී නොතිබීම | නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|---|
| මුදල් රෙගුලාසි | | | |
| 127(1)(අ) | නිවැරදිව සහ මූල්‍ය විධිමත් බවෙන් යුක්තව කටයුතු කරන බව තහවුරුවන පරිදි සියළු මූල්‍ය කාර්යයන් සැලැසුම් කළ යුතු වීම. | 1. ක්‍රියාකාරී සැලැස්ම නිවැරදි ලෙස පිළියෙල කර නොතිබුණි. | 2.3.1 |
| | | 2. ප්‍රසම්පාදන කටයුතු ප්‍රමාණවත් පරිදි සැලැසුම් නොකිරිම | 2.5.1 |
| | | 3. අයවැය ඇස්තමේන්තු තාත්ත්වික ලෙස පිළියෙල නොකිරිම | 2.14 |
| | | 4. ලේඛන හා පොත් පවත්වා නොතිබිම | 2.17 |
| | | 5. අභ්‍යන්තර විගණනයේ වූ අඩුපාඩු | 2.19 |
| 127(1)(ආ) | වියදම් සහ රාජ්‍ය ආදායම් එකතු කිරීම පිළිබඳව ප්‍රමාණවත් තරම් පාලනයකට විධිවිධාන සැලැසෙන ක්‍රමයක් සම්පාදනය කළ යුතුවීම. | 1. අවිධිමත් ගනුදෙනු | 2.8 |
| | | 2. කළමනාකරණ අඩුපාඩු | 2.11 |
| | | 3. විසදා නොතිබුණු විගණන ඡේද | 2.10 |
| | | 4. අනුකූල නොවීම් | 2.18 |
| | | 5. මානව සම්පත් කළමනාකරණයේ අඩුපාඩු. | 2.20 |

| | | | |
|---|---|---|---|
| 127(2) | තමාගේ පාලනය යටතේ පවත්නා දෙපාර්තමේන්තුවල එවකට තිබෙන වැය විෂයයන් මෙන්ම අළුතින් හෝ වැඩියෙන් වියදම් කිරීම සඳහා වන යෝජනා සකසුරුවම්කම හා කාර්යක්ෂමතාවය අතින් අමාත්‍යාංශයේදී තියුණු පරීක්ෂාවකට භාජනය කිරීම. | 1. අපේක්ෂිත නිමැවුම් මට්ටම ලබා නොගැනීම | 2.3.2(ආ) |
| | | 2. අපේක්ෂිත ප්‍රතිඵල ලබා නොගැනීම | 2.3.2(ඇ) |
| | | 3. ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම | 2.3.2(ඈ) |
| | | 4. ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන් | 2.3.2(ඉ) |
| | | 5. මුදල් නිදහස් කර තිබුණත්, ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති | 2.3.2.( ඊ) |
| | | 6. කාල පමාවකින් පසු වැඩ ආරම්භ කළ ව්‍යාපෘති | 2.3.2(උ) |
| | | 7. විදේශාධාර ව්‍යාපෘති නියමිත දිනයට ආරම්භ නොකිරීම | 2.4.1(අ)(ii) |
| | | 8. ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ අඩුපාඩු | 2.5.2 |
| | | 9. අභ්‍යන්තර විගණනය | 2.19 |
| 127(3) | ස්වකීය පරිපාලනාත්මක කෘතහස්තතාව හා විචාර බුද්ධිය මෙහෙයවා සුදුසු පරිදි ක්‍රියා කළ හැකි වන පිණිස සැකැයක් හෝ උද්ගත වී ඇති සියළු ප්‍රශ්ණ තමා වෙත ඉදිරිපත් වෙන ආකාරයක් සලසා තිබීම. | 1. රඳවා ගත් ව්‍යාපෘතියේ මුදල් | 2.11(අ) |
| | | 2. වාහන උපයෝජනයේ අඩුපාඩු | 2.6. (අ) |
| | | 3. මූල්‍ය හා මෙහෙයුම් කල් බදු ක්‍රමය යටතේ වාහන උපයෝජනය කිරීමේ අඩුපාඩු | 2.6. (ආ) |
| | | 4. කාර්යාල පවත්වා ගැනීමේ අඩුපාඩු | 2.6(ඇ) |
| | | 5. බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම් | 2.6(ඉ) |
| | | 6. මහජනයා සඳහා සේවා ඉටු කිරීමේ දුර්වලතා | 2.12 |
| | | | 2.7(අ) |

| | | | |
|---|---|---|---|
| 127(4) | තමාගේ එක් එක් ගණන්දීමේ නිලධාරියා විසින් විසර්ජන ගිණුම් විධිවූ පරිදි ඉදිරිපත් කරන බවට හා තමා ඒවා අත්සන් කිරීමට පෙර අමාත්‍යාංශයේදී පරීක්ෂා කරනු ලබන බවටත්, එසේම ඇස්තමේන්තුවල ප්‍රතිපාදිත මුදල සහ තථ්‍ය වියදම අතර පවත්නා සැලැකිය යුතු වෙනස්කම් තමා විසින්ම, දැඩි ලෙස විමර්ශනයට භාජනය කිරීම | 1. වාර්ෂික අයවැය සීමාව ඉක්මවා බැදීම්වලට එළඹීම | |
| | | 2. බැරකම් වැඩියෙන් සටහන් කිරීම | 2.7(ආ) |
| 127(5) | දෙපාර්තමේන්තුවේ ඇස්තමේන්තුවල ප්‍රතිපාදිත මුදල හා වියදම අතර ඇති සැලැකිය යුතු වෙනස්වීම් අමාත්‍යාංශයේ දැඩි ලෙස පරීක්ෂණයට භාජනය කෙරෙන බව | 1. සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම | 2.14(අ)(i) |
| | | 2. අධි ප්‍රතිපාදන සලසා තිබීම | 2.14(අ)(ii) |
| | | 3. පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරීම් මගින් ලබාගත් ප්‍රතිපාදන උපයෝජනය කිරීමේ අඩුපාඩු | 2.14( අ)(iii) |
| | | 4. රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ සඳහන් අඩුපාඩු | 2.15 |
| 127(7) | නිලධාරීන්ගේ/සේවකයින්ගේ ප්‍රමාදය, නොසැලැකිල්ල, වරද හෝ වංචාව නිසා රජයට පාඩු සිදු වී ඇති අවස්ථාවලදී මුදල් රෙගුලාසි 103 සිට 108 දක්වා රෙගුලාසිවල නියම කර ඇති කාර්ය පරිපාටිය ගණන්දීමේ නිලධාරීන් විසින් අනුගමනය කරනු ලබන බවටද, මුදල් රෙගුලාසි 156(1) අනුව එම පාඩු සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්/සේවකයන් මත අධිභාර පැනවීමද, වගබලා ගැනීම පිණිස විධිවිධාන යොදන ලද්දේනම් තමා වෙත පැවරී ඇති වගකීම්වලින් ගණන්දීමේ නිලධාරියා නිදහස් වූවාක් ලෙස සලකනු ලැබේ. රාජ්‍ය ගිණුම් කාරක සභාව හමුවේ | | 2.9 |
| | | 1. හානි පිළිබඳ වගකීම | |
| | | 2. මුදල් සම්බන්ධව කටයුතු කරන නිලධාරීන්ගෙන් ඇප තැන්පත් ලබා නොගැනීම. | 2.21 |

පෙනී සිට, තමා වගකීම් දරන දෙපාර්තමේන්තුවල ගිණුම් පැහැදිලි කිරීමෙන් හා සාධාරණීය කිරීමෙන් ගණන්දීමේ නිලධාරියා සමඟ සහාය වීමද ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ රාජකාරී භාරයක් වීම.

**මුදල් රෙගුලාසි 128 ප්‍රකාර ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය**

**-----------------------------------------------------------------**

මුදල් රෙගුලාසි

**------------------**

| | | | |
|---|---|---|---|
| 128(1)(අ) | රජය විසින් නියමකර දක්වා ඇති ප්‍රතිපත්තිය හා බලය දෙනු ලැබූ කටයුතු සඳහා මුල්‍ය ප්‍රතිපාදන සලසා දීමෙහිලා පාර්ලිමේන්තුවේ අභියෝගයන් ගැන සැලැකිල්ලට ගෙන තම දෙපාර්තමේන්තුවේ කටයුතු විචක්ෂණ භාවයෙන් යුක්තව සැලැසුම් කර ක්‍රියාත්මක කරන බව සහ ප්‍රස්තුත වර්ෂය සඳහා නියමිත වැඩසටහන සම්පූර්ණ කිරීමට සහ/හෝ නියමිත ඉලක්කය සාක්ෂාත් කර ගැනිමට පරිශ්‍රමයක් දරන බවත්, | 3. ක්‍රියාකාරී සැලැස්ම නිවැරදි ලෙස පිළියෙල කර නොතිබුණි. | 2.3.1 |
| | | 4. ප්‍රසම්පාදන කටයුතු ප්‍රමාණවත් පරිදි සැලැසුම් නොකිරිම | 2.5.1 |
| | | 5. අයවැය ඇස්තමේන්තු තාත්ත්වික ලෙස පිළියෙල නොකිරිම | 2.14 |
| | | 6. ලේඛන හා පොත් පවත්වා නොතිබිම | 2.17 |
| | | 7. අපේක්ෂිත නිමැවුම් මට්ටම ලබා නොගැනීම | 2.3.2(ආ) |
| | | 8. අපේක්ෂිත ප්‍රතිඵල ලබා නොගැනීම | 2.3.2(ඇ) |
| | | 9. ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම | 2.3.2(ඇ) |
| | | 10. ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන් | 2.3.2(ඉ) |
| | | 11. මුදල් නිදහස් කර තිබුණත්, ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති | 2.3.2(ඊ) |
| | | 12. ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ අඩුපාඩු | 2.5.2 |

| | | | |
|---|---|---|---|
| 128(1)(ආ) | තම දෙපාර්තමේන්තුවේ මුල්‍ය පාලනය හා ගිණුම්කරණය සඳහා සංවිධානය සාර්ථක බවට සහ අවශ්‍ය අවස්ථාවලදී රජයට ලැබිය යුතු ගාස්තු නිවැරදිව නිශ්චය කිරීමට ඒවා ක්‍රමානුකූලව ද සම්පූර්ණයෙන්ම ද අප්‍රමාදව ද එකතු කර ගැනීමට සහ ලැබෙන මුදල් ගිණුම්ගත කිරීමටද, රජය වෙනුවෙන් වගකීම්වලට බැඳීම් සඳහා බලය දීමටද ඉටුකරන ලද සේවාවන් සැපයීම් අධීක්ෂණය හා පරීක්ෂා කිරීමට සහ එම රජයේ අරමුදලින් ඒ සඳහා අප්‍රමාදව හා නිවැරදිව ගෙවීම් කිරීමට ඉන් ප්‍රමාණවත් තරම් විධිවිධාන සලසන බවත් | 1. අපේක්ෂිත නිමැවුම් මට්ටම ලබා නොගැනීම | 2.3.2(ආ) |
| | | 2. ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම | 2.3.2(ඇ) |
| | | 3. ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන් | 2.3.2(ඉ) |
| | | 4. විදේශාධාර ව්‍යාපෘති නියමිත දිනයට ආරම්භ නොකිරීම | 2.4.1(අ)(ii) |
| | | 5. ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ අඩුපාඩු | 2.5.2 |
| | | 6. මහජනයා සඳහා සේවා ඉටු කිරීමේ අඩුපාඩු | 2.12 |
| 128(1)(ඇ) | මුදල් රෙගුලාසි හා රජයේ වෙනත් පරිපූරක නියමයන් තම දෙපාර්තමේන්තුවේදී පිළිපදිනු ලබන බවට හා අවශ්‍ය අවස්ථාවලදී ඒවාට අතිරේක වශයෙන් දෙපාර්තමේන්තු නියමයන් නිකුත් කරන බවත් | 1. ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම | 2.17 |
| | | 2. අනුකූල නොවීම් | 2.18 |
| 128(1)(ඈ) | ලැබීම්, ගෙවීම් හා නිකුත් කිරීම් සඳහා ප්‍රමාණවත් අභ්‍යන්තර සෝදිසි ක්‍රමයක් පවත්වා ගෙන යන බවට හා ඒ ක්‍රමයේ ක්‍රියාකාරීත්වය කලින් කල සෝදිසි කරන බවත්, | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ සඳහන් අඩුපාඩු | 2.15 |
| 128(1)(ඉ) | රජය සතු වූ හෝ රජයේ භාරයේ පවත්නා මුදල් බඩුබාහිර උපකරණ හා වෙනත් වත්කම් සුරක්ෂිතව තබා ගැනීම සහ සංරක්ෂණය | 1. වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයන් කිරීමේ අඩුපාඩු | 2.6(ඇ) |

| | | | |
|---|---|---|---|
| | සඳහා ප්‍රමාණවත් තරම් සහ විධිමත් විධිවිධාන යොදවනු ලබන බව, ඒවා වරින්වර සත්‍යාපනය කරනු ලබන බවටත්, ඒවා නිසියාකාරව නිෂ්කාශණය කරනු ලබන කල්හි එසේ නිෂ්කාශණය කිරීම නියමිත රෙගුලාසිවලට හා උපදෙස්වලට අනුකූලව කරනු ලබන බවත් | 2. වත්කම් කළමනාකරණයේ අඩුපාඩු | 2.6 |
| 128(1)(ඊ) | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා හෝ භාණ්ඩාගාරය හෝ විසින් ඉල්ලා සිටින තොරතුරු, ප්‍රකාශ හා වාර්තා නිවැරදිව කලට වේලාවට ඉදිරිපත් කරන බවත්, | 1. ක්‍රියාකාරී සැලැස්ම නිවැරදි ලෙස පිළියෙල කර නොතිබුණි. | 2.3.1 |
| | | 2. ප්‍රසම්පාදන කටයුතු ප්‍රමාණවත් පරිදි සැලැසුම් නොකිරිම | 2.5.2 |
| | | 3. අයවැය ඇස්තමේන්තු තාත්ත්වික ලෙස පිළියෙල නොකිරිම | 2.14(අ) |
| 128(1)(උ) | රජයට ලැබිය යුතු මුදල් එකතු කිරිම පිළිබඳ ප්‍රගතිය දැක්වෙන වාර්තා නිතිපතා ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාට යවන බවත්, | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම සම්බන්ධයෙන් | 2.15 |
| 128(1)(ඌ) | හිඟව තිබෙන ගාස්තු යනාදිය අයකර ගැනිමට විශේෂ විධිවිධාන යොදන බවට සහ එම කාර්ය පැවැරී ඇති නිලධාරීන් විසින් හිඟ මුදල් පිළිබඳව ඒවා අයකර ගැනීම කඩිනම් කිරීමට ගනු ලැබූ පියවර පිළිබඳව යටත් පිරිසෙන් තුන් මාසයකට වරක් හෝ අන්‍යාකාරයකින් විධානය කළ පරිදි හෝ තමා වෙත වාරතා කරන බවත්, | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ හිඟහිටි ණය ශේෂ අයකර ගැනීම | 2.15(අ) |

| | | | |
|---|---|---|---|
| 128(1)(එ) | රජයේ කටයුතු ඉටු කිරීමේදී අපේක්ෂිත අරපිරිමැස්ම, කාර්යක්ෂමතාව, විධිමත්බව හා අවංකභාවය යන කරුණු පිළිබඳ නිසි සැලැකිල්ලෙන් යුක්තව තම දෙපාර්තමේන්තුවේ කටයුතු කරගෙන යන බවත්, | 1. අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම<br>2. අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම<br>3. ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම<br>4. ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්<br>5. මුදල් නිදහස් කර තිබුණත්, ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති<br>6. කාල පමාවකින් පසු වැඩ ආරම්භ කළ ව්‍යාපෘති<br>7. විදේශාධාර ව්‍යාපෘති නියමිත දිනයට ආරම්භ නොකිරීම<br>8. අවිධිමත් ගනුදෙනු | 2.3.2(ආ)<br>2.3.2(ඇ)<br>2.3.2(ඈ)<br>2.3.2(ඉ)<br>2.3.2(ඊ)<br>2.3.2.(උ)<br>2.4.1(අ)<br>2.8 |
| 128 (1) (ග) | ඇප තැබීමට බැඳී සිටින නිලධාරීන් එවකට වලංගු නීතිය හා නියමයන් අනුව ඇප තබන බව | අදාළ නිලධාරීන්ගෙන් ඇප ලබා ගැනීමේ අඩුපාඩු | 2.21 |
| 128(1)( ජ) | නිලධාරීන්ගේ/සේවකයින්ගේ ප්‍රමාදය, නොසැලැකිල්ල, වරද හෝ වංචාව නිසා රජයට පාඩු සිදු වී ඇති අවස්ථාවලදී මුදල් රෙගුලාසි 103 සිට 108 දක්වා රෙගුලාසිවල නියම කර ඇති කාර්ය පරිපාටිය ගණන්දීමේ නිලධාරීන් විසින් අනුගමනය කරනු ලබන බවටද, මුදල් රෙගුලාසි 156(1) අනුව එම පාඩු සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්/සේවකයන් මත අධිභාර පනවනු ලබන බව | 1. හානි පිළිබඳ වගකීම<br>2. මුදල් සම්බන්ධව කටයුතු කරන නිලධාරීන්ගෙන් ඇප තැන්පත් ලබා නොගැනීම. | 2.9<br>2.21 |

**2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

---------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් නිකුත් කල 2015 සැප්තැම්බර් 21 දින අංක 1933/13 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මගින් වැවිලි නිවාස සංවර්ධන භාරය කඳුරට නව

ගම්මාන යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය යටතේ ඇති ආයතනයක් ලෙස නම් කර ඇති නමුත් 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ මෙම ආයතනය වැව්ලි මානව සංවර්ධන භාරය ලෙස ලියාපදිංචි කර ස්ථාපිත කර ඇති ඇපයෙන් සීමිත සමාගමක් වන අතර මෙම සාංගමික ව්‍යවස්ථාවලියෙහි 44 වන ඡේදය අනුව ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලයට පත්කරනු ලබන අධ්‍යක්ෂවරු අතරින් සිව්දෙනෙකු රජයේ අමාත්‍යාංශය මගින් පත්කරනු ඇත. මෙම ආයතනය නම් දෙකකින් හඳුන්වන බව ද වැඩිදුරටත් නිරීක්ෂණය විය.

(ආ) 2005 අංක 19 දරණ පනතින් පනතේ කාර්යයන් සඳහා මුල්‍ය ප්‍රතිපාදන පදනම විසින් සපයා ගතයුතු බව දක්වා සෞම්‍යමූර්ති තොණ්ඩමන් අනුස්මරණ පදනම ස්ථාපිත කර ඇත. නමුත් පදනමේ සියළු අයහාර හා ප්‍රාග්ධන වියදම් අමාත්‍යාංශය වැයකර තිබූ අතර 2016 ජූනි 06 දිනැති අමාත්‍යමණ්ඩල සන්දේශයට අනුව පූල් බෑංක් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, රම්බොඩ සංස්කෘතික මධ්‍යස්ථානය, නෝර්වුඩ් ක්‍රීඩා සංකීර්ණය හා ප්‍රජා ශක්ති මධ්‍යස්ථානය යන ආයතන හතර අමාත්‍යාංශයට පවරා ගැනීමට 2016 ජූනි 29 දින අමාත්‍යමණ්ඩල අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ අනුමැතිය ඇතිව 2017 වර්ෂයේ සිට සෞම්‍යමූර්ති තොණ්ඩමන් අනුස්මරණ පදනමට අදාලව සියළු ගෙවීම් කටයුතු මෙම අමාත්‍යාංශයේ ජංගම ගිණුම මගින් සිදු කරලීමටත්, එකතු ආදායම් ඒකාබද්ධ අරමුදලට ගිණුම් ගත කිරීම සිදුකරමින් පවතී. 2017 වර්ෂය සඳහා සෞම්‍යමූර්ති තොණ්ඩමන් අනුස්මරණ පදනම සියලු වියදම් අමාත්‍යාංශ වැය ශීර්ෂය යටතේ දරා ඇති බැවින් ගිණුම් පොත් පත් පවත්වා නොගැනීම හේතුවෙන් මෙම තොණ්ඩමන් අනුස්මරණ පදනම පනතට අනුව අහෝසි කිරීමක් සිදුකර නැති නමුත් පනත අනුව ඉදිරිපත් කල යුතු අවසන් ගිණුම් ඒ ආකාරයෙන් ඉදිරිපත් කල නොහැකි තත්ත්වයකට වර්තමාණයේ පත්ව ඇත.

## 2.1 කාර්යසාධනය

----------------

**සැලැසුම් කිරිම**

----------------

2014 පෙබරවාරි 17 දිනැති 01/2014 අංක දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2017 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශය විසින් ඉටු කළ යුතු ප්‍රධාන කාර්යභාරයන් 05 ක් පැවැති අතර, අමාත්‍යාංශය යටතේ ඇති ව්‍යවස්ථාපිත ආයතන 02 ක, විදේශ ව්‍යාපෘති 02 ක හා අරමුදල් 01 කින් අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීම සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්ම සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) අමාත්‍යාංශයේ 2017 වර්ෂයට අනුමත ක්‍රියාකාරී සැලැස්ම තුල 2014 පෙබරවාරි 14 දින මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය විසින් නිකුත්කල රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2014 හි 03 ඡේදයේ දක්වා ඇති පරිදි වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම තුල අන්තර්ගත කලයුතු පහත තොරතුරු අන්තර්ගත නොවූ බව නිරීක්ෂණය විය.

(i) අදාල වර්ෂයට යාවත්කාලීන කල ආයතනයේ සංවිධාන ව්‍යුහය, අනුමත කාර්ය මණ්ඩලය සහා තත්‍ය කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර

(ii) වාර්ෂික ක්‍රියාකාරකම් සඳහා අක් මුදල් අවශ්‍යතා සැලැස්ම

(ආ) සෞම්‍යමූර්ති තොණ්ඩමන් අනුස්මරණ පදනම යටතේ පැවති 2016 ජූනි 29 දිනැති අමාත්‍යමණ්ඩල තීරණයට අනුව පූල් බෑන්ක් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, රම්බොඩ සංස්කෘතික මධ්‍යස්ථානය, නෝර්වුඩ් ක්‍රීඩා සංකීර්ණය හා ප්‍රජා ශක්ති (E –Kiosk) මධ්‍යස්ථානය යන ආයතන

හතර අමාත්‍යාංශයට පවරා ගැනීමට කටයුතු කර ඇත. නමුත් එම එක් එක් ආයතනය මගින් 2017 වර්ෂය තුල ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන් හා අපේක්ෂිත නිමවුම් වෙන් වෙන් වශයෙන් ක්‍රියාකාරී සැලැස්ම හා කාර්යසධන වාර්තාව තුල දක්වා නොමැත.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාළ වාර්ෂික අයවැය පදනම් කර ගත් ප්‍රමුඛතා අනුව සකස් කළ ක්‍රියාකාරකම් සැලැසුම (Activity Plan), ක්‍රියාත්මක කළ කාල රාමුව (Time Line) හා එම ක්‍රියාකාරකම්වල අපේක්ෂිත නිමවුම්/ ප්‍රතිඵල (Output/ Outcome) ඇස්තමේන්තු කර සඳහන් කර නොතිබුණි.

(ඈ) ක්‍රියාකාරී සැලැස්ම හා කාර්යසාධන වාර්තාව එක් එක් ව්‍යාපෘති යටතේ මූල්‍ය හා භෞතික ඉලක්ක සටහන් නොකිරීම හා මුළු ව්‍යාපෘති වල වටිනාකමත් ක්‍රියාත්මක කරන කාලය මුළු වර්ෂයම ලෙස පමණක් සටහන් කිරීමත් නිසා 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ භෞතික හා මූල්‍ය කාර්යයසාධනයේ සත්‍ය තත්ත්වය එමගින් පරීක්ෂා කළ නොහැකි විය.

## 2.2 කාර්යභාරයන් ඉටු නොකිරිම

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කාර්යභාරයන් ඉටු නොකිරීම**

---------------------------------------------------------------

(i) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව අමාත්‍යාංශය විසින් ප්‍රධාන කාර්යභාරයන් 05 ක් ඉටු කළ යුතුව තිබුණත්, ඉන් කාර්යභාරයන් 04 ක් පමණක් ඉටු කර තිබුණි. එසේ ඉටු නොකළ හැටන් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය වැඩිදියුණු කිරීමේ වැඩසටහන සඳහා රු.මිලියන 132 ක ප්‍රතිපාදන සලසා තිබුණි.

(ii) ක්‍රියාකාරී සැලැස්ම අනුව නිවාස ඉදිකිරීම හා යටිතල පහසුකම් සැපයීමේ කාර්යභාරය ඉටු කිරිමෙන් ප්‍රතිඵල අත්පත් කර ගැනිමට (Output) අපේක්ෂා කර තිබුණත්, ප්‍රසම්පාදනයන් සැලැසුම් කළ පරිදි ඉටු කිරීමට නොහැකිවීම නිසා වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් සලසා තිබුණු රු.මිලියන 1,915 ක ප්‍රතිපාදන ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

**(ආ) අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනිම**

--------------------------------------------------

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ දක්වා තිබුණු කාර්යභාරයන් 05ක් ඉටු කිරීම සඳහා විවිධ වැඩසටහන් 16 ක් සඳහා රු. මිලියන 2,104 ක ප්‍රතිපාදන උපයෝජනය කර තිබුණත්, එයින් අපේක්ෂිත නිමවුම් මට්ටම (Output) අත්පත් කර ගෙන නොතිබුණු අවස්ථා නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

(i) ක්‍රියාකාරී සැලැස්ම අනුව 2017 වර්ෂය තුළ නිමකිරීමට යෝජිත වූ නිවාස සංඛ්‍යාව 2,500 ක් විය. වර්ෂය තුළ සම්පූර්ණයෙන් නිම කර ඇති නිවාස සංඛ්‍යාව 692 ක් ද, සියයට 80ක් දක්වා නිමකල නිවාස සංඛ්‍යාව 455 ක්ද සියයට 60 ත් 80ත් අතර නිමකල නිවාස සංඛ්‍යාව 493 ක්ද, ආරම්භකර හෝ නොමැති නිවාස සංඛ්‍යාව 221ක්ද විය. මෙම නිවාස ව්‍යාපෘතිය සඳහා වෙන් කරන ලද මුදල රු.මිලියන 2,000 ක් වන අතර එම මුදලින් රු. මිලියන 1,431 ක් හෙවත් සියයට 72 ක මූල්‍ය ප්‍රගතියක් අත් කරගෙන තිබුනත් සම්පූර්ණයෙන් නිම කර ඇති නිවාස භෞතික ප්‍රගතිය සියයට 20.04 ක් විය.

(ii) ක්‍රියාකාරී සැලැස්ම හා 2018 ජූලි 03 දින පාර්ලිමේන්තුවෙහි සභාගත කල 2017 වර්ෂයට අදාල කාර්යයසාධන වාර්තාව පරික්ෂාවේදී, වැඩසටහන් 05ක් යටතේ ව්‍යාපෘති 16ක් ක්‍රියාත්මක වූ අතර වැඩසටහන් 04 කට අදාල ව්‍යාපෘති 08 ක භෞතික ප්‍රගතිය සියයට2.5 සිට සියයට 54.68 අතර වූ විගණනයේදී නිරීක්ෂණය විය.

**(ඇ) අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම**

**--------------------------------------------------------**

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ දක්වා තිබුණු කාර්යභාරයන් 05 ක් ඉටු කිරීම සඳහා විවිධ ව්‍යාපෘති 16 ක් සඳහා රු. මිලියන 2,104 ක ප්‍රතිපාදන උපයෝජනය කර එයින් අපේක්ෂිත නිමවුම් මට්ටම (Output) අත්පත් කර ගෙන නොතිබුණි. විස්තර පහත දැක්වේ.

(i) පර්චස් 7 ක ඉඩමක්ද, නිවසක්ද ජල හා විදුලි පහසුකම් රජයෙන් ලබාදුන්නද, නිවාසවල රජයෙන් ඉටු කළ යුතු වැඩ කොටස නිම කර තිබුණද, නුවරඑළිය දිස්ත්‍රික්කයේ වතු 11ක් යටතේ නිවාස 220 ක් නිම කළ නිවාස වලට ප්‍රතිලාභීන් විවිධ අඩුපාඩු පෙන්වාදී පදිංචියට පැමිණ නොමැති අවස්ථා ගණනාවක් විගණනයට නිරීක්ෂණය විය.

(ii) මහඋෘව වත්ත පහළ කොටස රන් හරිත නිවාස 15 කට අදාළව ගිවිසුම්ගත වටිනාකම රු. මිලියන 9.75 වන අතර නිවාස 15 ක ඉදිකිරීම් කටයුතු අවසන් කළත් ජල සැපයම් නොසැපයීම මත විගණන දින වන 2017 නොවැම්බර් 16 දින දක්වාම ප්‍රතිලාභීන් පදිංචි කරවා නොතිබුණි.

(iii) ඩෙස්පර්ඩ් ඉහළ සහ පහළ කොටස ජල සැපයුම ව්‍යාපෘතියට අදාලව ගිවිසුම්ගත මුදල රු. මිලියන 2.14 ජල නල එළීම සඳහා දුම්රිය දෙපාර්තමේන්තුවෙන් අවසර නොලැබීම නිසා ජල පහසුකම් ලබාගෙන නොතිබීම හේතුවෙන් ප්‍රතිලාභීන් තවදුරටත් තාවකාලික කුඩාරම්වල ජීවත් වන බව නිරීක්ෂණය විය.

(iv) ඩෙස්ෆෝඩ් ලෝන් කොටස වතු නිවාස 15 ව්‍යාපෘතියට අදාලව ගිවිසුම්ගත මුදල රු. මිලියන 9.75 ක් වන අතර මෙම නිවාස 2017 නොවැම්බර් 15 දින වන විට ඉදිකර තිබුණත්, එහි විදුලිය නොමැති වීම හේතුවෙන් කිසිදු ප්‍රතිලාභියෙකු පදිංචි වී නොතිබුණි.

(v) වතු අංශය යටතේ ජාතික තිරසාර සංවර්ධනය ලඟා කර ගැනීමට 2016 මාර්තු මස මෙම අමාත්‍යාංශය විසින් එළිදක්වන ලද වැවිලි ප්‍රජා සමාජ සංවර්ධනය සඳහා වූ ජාතික ක්‍රියාකාරී සැලැස්මට අනුව 2016- 2020 යන වසර පහ තුල ලඟා කර ගැනීමට අපේක්ෂිත ඉලක්ක අනුව 2017 වර්ෂයට අදාළ ඉලක්ක නිමවුම හා 2017 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව ඉලක්ක නිමවුම අතර සැලකිය යුතු වෙනසක් පහත පරිදි පවතින බව නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| අනු අංකය | ව්‍යාපෘතිය/ ක්‍රියාකරකම | 2016- 2020 වැවිලි ප්‍රජා සමාජ සංවර්ධනය සඳහා වූ ජාතික ක්‍රියාකාරි සැලැස්මට අනුව | | 2017 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව ඉලක්ක නිමවුම | වෙනස | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|
| | | මුළු ඉලක්ක නිමවුම | 2017 වර්ෂයට අදාළ ඉලක්ක නිමවුම | | | |
| | | ඒකක | ඒකක | ඒකක | ඒකක | |
| 01 | පේලි නිවාසයන්හි වහල නැවත සෙවිලි කිරීම | 50,000 | 10,000 | 1640 | 8,360 | 83.6 |
| 02 | සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම- වැසිකිලි ඉදිකිරීම | 20,000 | 4,000 | 650 | 3,350 | 83.75 |
| 03 | ළමා සංවර්ධන මධ්‍යස්ථාන වැඩිදියුණු කිරීම | 1,000 | 25 | 23 | 2 | 8 |
| 04 | හරිත රන් නිවාස ව්‍යාපෘතිය | 52,500 | 10,500 | 2,500 | 8,000 | 76.2 |

**(ඇ) ව්‍යාපෘතිය නිම නොකර අත්හැර දැමීම**

(i) අමාත්‍යාංශය විසින් ප්‍රධාන කාර්යභාරයන් ඉටු කිරිම සඳහා පහත සඳහන් ව්‍යාපෘති ආරම්භ කර තිබුණත්, එම ව්‍යාපෘති නිම නොකර අතහැර තිබුණි.

| ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත පිරිවැය | ආරම්භ කළ දිනය | 2017 දෙසැම්බර් 31 දිනට වියදම | අත්හැර දැමීමට හේතු |
|---|---|---|---|---|
| | රු.මිලියන | | රු. | |
| නිවාස ව්‍යාපෘතිය නුවරඑළිය දිස්ත්‍රික්කය බැල්මොරල් Cranely | 25 | 28/04/2017 | නැත | සුදුසු භූමියක් සොයා ගැනීමට අපොහොසත් වීම |

| | | | | |
|---|---|---|---|---|
| නිවාස ව්‍යාපෘතිය මිල්ලවිටිය/ පාරකෙටිය රත්නපුර දිස්ත්‍රික්කය | 1 | 27/07/2017 | 25,000 | ප්‍රතිලාභීන් එම ස්ථානයට අකමැති වීම |
| නිවාස ව්‍යාපෘතිය කිල්ලිනරි ක්‍රයිහෙඩ් -හැටන් | 30 | 27/04/2017 | නැත | සුදුසු භූමියක් සොයා ගැනීමට අපොහොසත් වීම |
| නිවාස ව්‍යාපෘතිය තෙරේසියා සමර්සෙට් - මහනුවර දිස්ත්‍රික්කය | 15 | 24/04/2017 | නැත | සුදුසු භූමියක් සොයා ගැනීමට අපොහොසත් වීම |
| නිවාස ව්‍යාපෘතිය - ගල්මුදුන -මහනුවර දිස්ත්‍රික්කය | 15 | 24/04/2017 | 375,000 | හේතුවක් ලිපිගොණුවේ දක්වා නොමැති අතර පැහැදිලි කිරීමක්ද නොලැබුණි. |

(ii) 2017 වර්ෂය තුල ඉදිකිරීමට නියමිත නිවාස ව්‍යාපෘතිය යටතේ ක්‍රියාකාරී සැලැස්ම තුල ඇතුලත් රු.මිලියන 151 ක් වටිනා නිවාස 151 ක් 2017 වර්ෂය තුල ආරම්භ කර හෝ නොමැති නිවාස ව්‍යාපෘති ලෙස පැවතුණි. විස්තර පහත දැක්වේ.

| **දිස්ත්‍රිකකය** | **වතුයාය** | | **නිවාස ඒකක** | **වටිනාකම** |
|---|---|---|---|---|
| | | | | රු. |
| ගාල්ල | කොබොවෙල | කොබොවෙල | 21 | 21,000,000 |
| | විල්ල කන්ද | සෙන්ට් ෆැන්සිස් | 6 | 6,000,000 |
| | විල්ල කන්ද | ඇන්ඩසන් | 05 | 5,000,000 |
| | විල්ල කන්ද | විගිරි ගී කැරල | 04 | 4,000,000 |
| | විල්ල කන්ද | නිව් | 05 | 5,000,000 |
| | පැලවත්ත | ගේවැස්ස ලෝවර් | 05 | 5,000,000 |
| හැටන් | ස්ට්‍රැඩන් | ස්ට්‍රැඩන් | 50 | 50,000,000 |
| | ඩස්වෝර්න් | කැස්ට්ලේරයි | 30 | 30,000,000 |
| | හැරින්ටන් | | 25 | 25,000,000 |
| **එකතුව** | | | **151** | **151,000,000** |

(ඉ) ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

--------------------------------

(i) අමාත්‍යාංශය විසින් පහත සඳහන් ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන් නිරීක්ෂණය විය.

| ව්‍යාපෘතිය | ඇස්තමේන්තු ගත පිරිවැය | ආරම්භ කළ දිනය | නිමකළ යුතු දිනය | 2017 දෙසැම්බර් 31 දිනට නිම කළ ප්‍රතිශතය | 2017 දෙසැම්බර් 31 දිනට වියදම | ප්‍රමාදයට හේතු |
|---|---|---|---|---|---|---|
| | රු.මිලියන | | | සියයට | රු.මිලියන | |
| ගාල්ල දිස්ත්‍රික්කය | | | | | | |
| නිවාස ව්‍යාපෘති 10ක් | 149.00 | 2017 අප්‍රේල් | 2017 දෙසැම්බර් | 20-73 | 63.71 | හේතු ඉදිරිපත් කර නොමැත. |
| නිවාස ව්‍යාපෘති 01ක් | 16.25 | 2016 ජූනි | සඳහන් කර නොමැත. | 99 | 16. 23 | හේතු ඉදිරිපත් කර නොමැත. |
| බදුල්ල දිස්ත්‍රික්කය | | | | | | |
| නිවාස ව්‍යාපෘති 07ක් | 231.00 | 2017 ආප්‍රේල් | 2017 දෙසැම්බර් | 22- 69 | 115.61 | හේතු ඉදිරිපත් කර නොමැත |
| නිවාස ව්‍යාපෘති 01ක් | 30.55 | 2016 ඔක්තොම්බර් | සඳහන් කර නොමැත. | 80 | 24.32 | සුදුසු භූමියක් සොයා ගැනීමට අපොහොසත් වීම |
| කෑගල්ල දිස්ත්‍රික්කය | | | | | | |
| නිවාස ව්‍යාපෘති 05ක් | 85.00 | 2017 ආප්‍රේල් | 2017 දෙසැම්බර් | 0 - 95 | 39.10 | බිල්පත් ඉදිරිපත් කිරීමේ ප්‍රමාදය. |
| නිවාස ව්‍යාපෘති 06ක් | 74.10 | 2016 මැයි | සඳහන් කර නොමැත. | 43 -84 | 40.97 | බිල්පත් ඉදිරිපත් කිරීමේ ප්‍රමාදය. |
| නිවාස ව්‍යාපෘති 01ක් | 7.80 | 2015 මාර්තු | සඳහන් කර නොමැත. | 34 | 2.69 | බිල්පත් ඉදිරිපත් කිරීමේ ප්‍රමාදය |
| රත්නපුර දිස්ත්‍රික්කය | | | | | | |
| නිවාස ව්‍යාපෘති 12ක් | 163.00 | 2017 මාර්තු | 2017 දෙසැම්බර් | 20 - 80 | 47.30 | සුදුසු භූමියක් සොයා ගැනීමට අපොහොසත් වීම |
| නිවාසව්‍යාපෘති 04ක් | 53.30 | 2016 මැයි | සඳහන් කර නොමැත. | 54 - 85 | 36.22 | සුදුසු භූමියක් සොයා ගැනීමට අපොහොසත් වීම |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| හැටන් දිස්ත්‍රික්කය | | | | | | |
| නිවාසවයාපෘති 24ක් | 653.00 | 2017 අප්‍රේල් | 2017 ජූනි | 20 - 80 | 272.21 | හේතු ඉදිරිපත් කර නොමැත |
| නිවාස ව්‍යාපෘති 3ක් | 148.74 | 2016 ජූනි | හේතු ඉදිරිපත් කර නොමැත | 33 -84 | 68.57 | හේතු ඉදිරිපත් කර නොමැත |
| නිවාස ව්‍යාපෘති 1ක් | 9.75 | 2015 ජනවාරි | හේතු ඉදිරිපත් කර නොමැත. | 77 | 7.51 | බිල්පත් ප්‍රමාද වී ඉදිරිපත් කර ඇත. |
| මහනුවර දිස්ත්‍රික්කය | | | | | | |
| නිවාස ව්‍යාපෘති 11ක් | 213.00 | 2017 මැයි | 2017 නොවැම්බර් | 20 - 80 | 98.47 | හේතු ඉදිරිපත් කර නොමැත |
| නිවාස ව්‍යාපෘති 05ක් | 52.00 | 2016 මැයි | හේතු ඉදිරිපත් කර නොමැත. | 54 - 84 | 37.81 | බිල්පත් ඉදිරිපත් කිරීමේ ප්‍රමාදය. |
| නුවරඑළිය දිස්ත්‍රික්කය | | | | | | |
| නිවාස ව්‍යාපෘති 14ක් | 330.00 | 2017 අප්‍රේල් | 2017 ඔක්තෝම්බර් | 20- 80 | 177.26 | මාස ගණනක් වැඩ නවතා තිබීම. |
| නිවාස ව්‍යාපෘති 1ක් | 37.70 | 2016 ජනවාරි | හේතු ඉදිරිපත් කර නොමැත. | 14 - 50 | 5.35 | ප්‍රමාද වී ආරම්භ කිරීම. |

(ii) 2017 පෙබරවාරි 06 දිනැති අංක අමප/17/0306/739/002 දරන අමාත්‍ය මණ්ඩල අනුමැතිය යටතේ ආපදාවන්ට ලක්වූවන් සඳහා හරිත රන් නිවාස යටතේ නිවාස ඉදිකරනු ලබන අතර එම නිවාස පූර්ණ රාජ්‍ය ආධාර යටතේ ඉදිකරනු ලබයි. 2017 වර්ෂයට අදාලව විගණනයට ඉදිරිපත් කරන ලද ව්‍යාපෘතිය පිළිබඳ ප්‍රගති (කාර්යයසාධන) වාර්තාව අනුව අනුමත නිවාස 367 කින් වැඩ නිම කිරීමේ තත්ත්වය මූලික අඩියර නිවාස 162ක්ද, පළමු අදියරේ නිවාස 60 ක්ද, තෙවන අදියරේ නිවාස 12ක් වන ලෙසට ඇති අතර තවත් නිවාස 133 ක් ආරම්භ කර හෝ නොතිබුණි. ව්‍යාපෘති ක්‍රියාකාරී සැලැස්මේ හෝ කාර්යය සාධන වාර්තාව තුල ආරම්භක කාලය හා අවසන් කාලය දක්වා නොමැති බැවින් ඉදිකිරීම්වල ප්‍රමාදය ගණනය කිරීමට නොහැකි විය.

(iii) පසුගිය වර්ෂයේ විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව අමාත්‍යාංශයේ 2017 ආරම්භයේදී අවිච්ඡේද නිවාස 937ක් තිබූ අතර එම නිවාස 2016 දෙසැම්බර් සිට 2017 නොවැම්බර් වන විට නිම කළ යුතු වුවත්, 2017 දෙසැම්බර් 31 දින වන විට නිමකර ඇති නිවාස සංඛ්‍යාව 479 ක් පමණක් විය. ඒ අනුව නිවාස 458 ක් 2017 දෙසැම්බර් 31 වන විටත් නිම නොකර පැවතුණි.

(ඊ) **මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති**

---

ඉදිකිරීම් සම්බන්ධව ගොඩනැගිලි දෙපාර්තමේන්තුව, ලංකා විදුලි බල මණ්ඩලය, ජාතික ජල සම්පාදන හා ජලපවාහන මණ්ඩලය, නාගරික සංවර්ධන අධිකාරිය වැනි ආයතනවලට මුළු මුදලම නිදහස් කර ඇති නමුත් වැඩ පිළිබඳ නිසි ප්‍රගතියක් නොමැති අවස්ථා පහත පරිදි විය.

(i) මැද කුඹුර වත්ත පහළ කොටස නිවාස 18 ව්‍යාපෘතිය සඳහා ගිවිසුම්ගත වටිනාකම රු.මිලියන 14.95 ක් වන අතර, 2016 දෙසැම්බර් 25 දිනට නිවාස 18ක් ඉදිකර පුද්ගලයින් පදිංචි කිරීමට කටයුතු කර තිබූ නමුත් නිවාස 05 ක් ප්‍රතිලාභීන් විගණන දින වන විටද නිවාසවල පදිංචි වී නොතිබුණි.

(ii) මැද කුඹුර වත්ත ඉහළ කොටස ක්‍රීඩාපිටිය සංවර්ධනය සඳහා, වැවිලි සංවර්ධන භාරය හා මැද කුඹුර වතු සමූපකාර සමිතිය සමඟ රු.මිලියන 1.41 කට ගිවිසුමකට එළඹ තිබූ අතර, ගිවිසුම ප්‍රකාරව 2017 ඔක්තෝබර් 06 දින එහි සංවර්ධනය කටයුතු අවසන් කළ යුතු වුවද ,2017 නොවැම්බර් 16 වන විටත් ප්‍රයෝජනයට ගත හැකි සුදුසු මට්ටමට ක්‍රීඩාපිටිය සකස් කර නොතිබුණි.

(උ) **කාල පමාවකින් පසුව වැඩ ආරම්භ කළ ව්‍යාපෘති**

---

ප්‍රමාද වී ව්‍යාපෘති ආරම්භ කර ඇති අවස්ථා පහත සඳහන් පරිදි විය.

(i) ඩයගම ඊස්ට් 3rd ඩිවිෂන් සංස්කෘතික මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු වටිනාකම රු.2,120,400 වන අතර එය ඉදි කිරීම සඳහා වැවිලි මානව සංවර්ධන භාරය හා වතු සමූපකාර සමිතිය සමඟ ගිවිසුමකට 2017 අගෝස්තු 4 දින එළඹ තිබූ අතර 2018 පෙබරවාරි 03 දින අවසන් කල යුතු වුවත් මෙම ඉදිකිරීම සඳහා ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ වාර්තාව මෙතෙක් ලැබී නොතිබීම හේතුවෙන් ගෙපොල කැපීම පමණක් 2017 නොවැම්බර් 15 දින වන විට සිදුකර තිබුණි.

(ii) යුලිෆීල්ඩ් නිවාස 27 ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තු වටිනාකම රු.මිලියන 27 වන අතර ගිවිසුම අනුව, 2017 මැයි 16 ව්‍යාපෘතිය ආරම්භ කර 2017 නොවැම්බර් 15 දිනට වැඩ නිම කළ යුතු වුවද, 2017 නොවැම්බර් 20 විගණිත දිනය වන වියත් නිවාස සඳහා ගෙපොල 22 ක් පමණක් කපා තිබූ අතර තවත් නිවාස 05 ක් සඳහා ඉඩම් වෙන් කර තිබුණි.

(iii) ට්‍රෙඩන් වතු නිවාස 50 ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තු වටිනාකම රු.මිලියන 49.40 වන අතර නිවාස ඉදිකිරීම වතු සමූපකාර සමිතිය විසින් ඒසර් ජේ ඉන්ජිනේරිං ලංකා පුද්ගලික සමාගම වෙත උප කොන්ත්‍රාත් ලබාදී තිබුණි. ගිවිසුම අනුව 2017 නොවැම්බර් 15 දිනට වැඩ නිම කළ යුතු වුවද, විගණිත 2017 නොවැම්බර් 21 දිනට මෙම නිවාස 50 න් නිවාස 19 ක ගෙපොල පමණක් කපා තිබුණු අතර, තවත් නිවාස 08 ක අත්තිවාරම නිමකර කුලුණු අර්ධ වශයෙන් නිමකර තිබුණි. ඉතිරි නිවාස 23 සඳහා ඉඩම් වෙන් කර ගෙන හෝ නොතිබුණි.

(iv) තලවාකැලේ නිවාස 20 ව්‍යාපෘතිය සඳහා ගිවිසුම්ගත වටිනාකම රු.මිලියන 19.76 වන අතර ගිවිසුම අනුව 2017 නොවැම්බර් 15 දිනට වැඩ නිම කළ යුතු වුවද, පිවිසුම් මාර්ගයේ ගැටළුවක් පැන නැගීම හේතුවෙන් විගණිත දිනය වන 2017 නොවැම්බර් 21 වන විටත් නිවාස 20 හීම අත්තිවාරම් දමා නිවාස 14 ක ප්ලින්ත් බීම් දමමින් පැවතුණි.

## 2.3 වාර්ෂික කාර්යසාධන වාර්තාව

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත සමාලෝචිත වර්ෂයට අදාළ කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, එම වාර්තාව දින 36 ප්‍රමාද වී 2018 ජූලි 05 දින පාර්ලිමේන්තුවේ සභාගත කර තිබුණි.

(ආ) ක්‍රියාකාරී සැලැස්ම අඩු පාඩු සහිතව පිළියෙල කිරීම නිසා කාර්යය සාධනය ඇගයීමට නොහැකි විය. විස්තර පහත දැක්වේ.

(i) ග්‍රාමීය ප්‍රදේශයන්හි ජීවනෝපාය හා මූලික පහසුකම් වැඩිදියුණු කිරීම වැඩසටහන යටතේ ක්‍රියාත්මක ප්‍රජා සංවර්ධනය සඳහා පහසුකම් සැපයීමේ ව්‍යාපෘතිය සඳහා රු. මිලියන 9.4 ක ප්‍රතිපාදන වෙන් කර ඇති නමුත් ඒ යටතේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ක්‍රියාකරකම්, ඉලක්ක නිමවුම හා මිනුම් ඒකක 2017 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම තුල දක්වා නොමැති බැවින් කාර්යසාධන වාර්තාවේ දක්වා ඇති ප්‍රගතිය නිවරදිව මිනුම් කල නොහැකි විය.

(ii) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව වැඩසටහන් 02 ක් යටතේ ව්‍යාපෘති 04 ක් සඳහා ක්‍රියාකාරී සැලැස්ම සැකසීමේදී ඉලක්ක ගත නිමවුම් සංඛ්‍යාව ඇතුලත් කර නොතැබීම හේතුවෙන් එම කාර්යයන්වල කාර්යසාධනය අපේක්ෂිත පරිදි ඉටු කර තිබුණු බව තහවුරු කර ගැනීමට නොහැකි වී තිබුණි.

(iii) පසුගාමී ප්‍රදේශ වල සමාජ ආර්ථික සංවර්ධනය වැඩසටහන යටතේ ක්‍රියාත්මක පහත ව්‍යාපෘති 03ට අදාලව ක්‍රියාකාරී සැලැස්මෙහි දක්වා තිබූ ඉලක්ක නිමවුම සහ කාර්යසාධන වාර්තාවෙහි දක්වා තිබූ ඉලක්ක නිමවුම අතර වෙනසක් පෙන්නුම් කරන බව නිරීක්ෂණය විය.

| වැඩසටහන | ව්‍යාපෘතිය/ ක්‍රියාකරකම | මිනුම් ඒකකය | ක්‍රියාකාරි සැලැස්ම අනුව ඉලක්ක නිමවුම | කාර්යසාධන වාර්තාව අනුව ඉලක්ක නිමවුම | වෙනස |
|---|---|---|---|---|---|
| පසුගාමී ප්‍රදේශ වල සමාජ ආර්ථික සංවර්ධනය | ජල සම්පාදන යොජනා ක්‍රම දියත් කිරීම හා වැඩිදියුණු කිරීම | නිම කල ජල සම්පාදන ක්‍රම ගණන | 80 | 69 | (11) |
| | ළමා සංවර්ධන මධ්‍යස්ථාන වැඩිදියුණු කිරීම | නිම කල ළමා සංවර්ධන මධ්‍යස්ථාන ගණන | 23 | 25 | 2 |
| | අනෙකුත් යටිතල හසුකම් සැපයීම | නිම කල සුළු ව්‍යාපෘති ගණන | 500 | 1000 | 500 |

2.4 **ක්‍රියාත්මක කර තිබුණු දේශීය හා විදේශ ආධාර ව්‍යාපෘති**

සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශය විසින් දේශීය අරමුදල් යොදවා ක්‍රියාත්මක කරන ව්‍යාපෘති 03 ක් සඳහා එකතුව රු.මිලියන 2,600 ප්‍රතිපාදන හා විදේශ ආධාර ව්‍යාපෘති 02 ක් සඳහා රු.මිලියන 1,420 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර ඉන් පිළිවෙලින් රු.මිලියන 1,741.39ක් හා රු.මිලියන 362.99 ක් වශයෙන් රු.මිලියන 2,104.38 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව රු.මිලියන 1,915.62 ක් හෙවත් සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 47.65 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි. විස්තර පහත දැක්වේ.

| ව්‍යාපෘති වර්ගය | ව්‍යාපෘතියේ නම | ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු | සලසා තිබුණු ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය |
|---|---|---|---|---|---|
| | | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| දේශීය අරමුදල් ව්‍යාපෘති | ග්‍රාමීය ප්‍රදේශයන්හි ජීවනෝපාය හා මූලික පහසුකම් වැඩිදියුණු කිරීම | ආදායම් උත්පාදනය ඉහළ නැංවීම, වෘත්තීය පුහුණුව හා ස්වයං රැකියා අවස්ථා ඉහළ නැංවීම,පොෂණ තත්ත්වය ඉහළ නැන්වීම තුලින් දිළිඳුකම පිටුදැකීම | 100.00 | 34.13 | 65.87 |

| | | | | | |
|---|---|---|---|---|---|
| දේශීය අරමුදල් ව්‍යාපෘති | පසුගාමී ප්‍රදේශයන්හි සමජ ආර්ථික සංවර්ධන ව්‍යාපෘතිය | පිරිසිදු පානීය ජලය, සනීපාරක්ෂක සේවා, වාසස්ථාන පහසුකම් වැඩිදියුණු කිරීම තුලින් මූලික අවශ්‍යතා සැපිරීම හා ළමා සුරක්ෂිතතාව හා පාසල් අධ්‍යාපනය තහවුරු කිරීම | 500.00 | 276.04 | 223.96 |
| දේශීය අරමුදල් ව්‍යාපෘති | වතු නිවාස වැඩසටහන | ලයින් කාමර ඉවත් කර නව වාසස්ථාන ලබා දීම | 2,000.00 | 1,431.22 | 568.78 |
| විදේශ ආධාර ව්‍යාපෘති | හැටන් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය වැඩිදියුණු කිරීම | නවීන තාක්ෂණික පාඨමාලා ආරම්භ කර වෘර්තීය අධ්‍යාපනය වැඩිදියුණු කිරීම | 120.00<br>12.00 | 0<br>0 | 120.00<br>12.00 |
| විදේශ ආධාර ව්‍යාපෘති | ඉන්දීය රජයේ ආධාර මත සිදු කරන නිවාස වැඩසටහන | ආපදා ප්‍රදේශවල ජීවත්වන්නන් සඳහා ආරක්ෂිත වාසස්ථාන සැපයීම | 1,134.00<br>154.00 | 346.01<br>16.90 | 787.91<br>137.10 |

**2.4.1 විදේශ ආධාර ව්‍යාපෘති**

පහත සඳහන් නිරක්ෂණයන් කරනු ලැබේ.

**(අ) විදේශාධාර ව්‍යාපෘතියේ කාර්යසාධනය**

(i) ඉන්දීය රජයේ ප්‍රදාන මත සිදු කරන නිවාස වැඩසටහන සඳහා 2017 වර්ෂය වෙනුවෙන් රු.මිලියන 1,288 ක ප්‍රතිපාදන වෙන් කර ඇත. මෙම ව්‍යාපෘතියේ ප්‍රථම අදියර වශයෙන් නිවාස ඒකක 1,134ක් ඉදිකිරීමේ කටයුතු ක්‍රියාත්මක වෙමින් පවතින අතර 2017 දෙසැම්බර් මස අවසන් වන විට නිවාස 100 ක ඉදිකිරීම සම්පූර්ණයෙන් අවසන් කර ඇත. ඉතිරි නිවාස 1,034 විවිධ ඉදිකිරීම් අදියරයන් හී පවතී.මෙම නිවාස ව්‍යාපෘතිය වෙනුවෙන් 2017 වර්ෂය සඳහා රජය විසින් රු. මිලියන 17 ක් වැය කර ඇති අතර 2017 වර්ෂය අවසානය වන විට මුළු වියදම රු. මිලියන 365 කි. එයින් මේ දක්වා වැයකර ඇති සමස්ථ දේශීය අරමුදල් ප්‍රමණය රු. මිලියන 19 කි. එම ව්‍යාපෘති සඳහා යටිතල පහසුකම් සැපයීමට රජයේ ප්‍රතිපාදන යටතේ රු.මිලියන 154 ක් 2017 වර්ෂය වෙනුවෙන් වෙන්කර තිබූ නමුත් රු.මිලියන 16.895 ක් පමණක් වැය කර තිබුණි.

(ii) ඉන්දියානු රජයේ ආධාර යටතේ හැටන් වෘත්තිය පුහුණු ආයතනයේ වැඩිදියුණු කිරීමට රු.මිලියන 120 ක විදේශාධාර වෙන් කර තිබූ නමුත් අමාත්‍යාංශය විසින් පිළියෙල කල යුතු ව්‍යාපෘති යෝජනාව පිළියෙල කිරීම ප්‍රමාද වීම හේතුවෙන් එම මුදල් 2017 තුළ වැය කර නොතිබුණි.

## 2.4.2 රාජ්‍ය පුද්ගලික හවුල්කාර පදනම මත නිවාස ඉදිකිරීම

------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අමාත්‍යාංශය හා සමාගමක් සමග 2017 සැප්තම්බර් 07 දින ඇති කරගත් ගිවිසුම අනුව රු.900,000 ක් වටිනා නිවසක් ඉදිකිරීම සඳහා අමාත්‍යාංශය රු.500,000ක්, සමාගම රු.350,000 හා ප්‍රතිලාභියා රු.50,000 ක් යොදන අතර නිවාස 10 සඳහා අමාත්‍යාංශ පිරිවැය රු.5,000,000 ක් වැයකර ඇති අතර ඒ සඳහා ලබාගත් භාණ්ඩාගාර අනුමැතිය විගණනයට ඉදිරිපත් නොවීය.

(ආ) ඉහත “අ” ඡේදයේ දැක්වෙන සමාගම ශ්‍රී ලංකාව තුල 2006 වර්ෂයේ සිට ස්ථාපිත වී තිබුණි.එම ආයතනයේ ප්‍රධාන ආදායම් මාර්ගය විදේශ ආධාර වන බව ආයතනයේ මූල්‍ය ප්‍රකාශ අනුව නිරීක්ෂණය විය. ඒ අනුව විදේශ ආධාර යටතේ වන එම ව්‍යාපෘතිය සම්බන්දව මු.රෙ 610 අනුව භාණ්ඩාගාරයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් සමග සාකච්ඡා පැවැත්විය යුතු වුවද භාණ්ඩාගාරය සමග සිදුවූ කිසිදු ලිපි හුවමාරුවක් සිදු වි නොමැති අතර 2017 වර්ෂය සඳහා ඉහත රාජ්‍ය නොවන සංවිධානය දැරූ මුදල් ගිණුම් ගත වීමක් සිදු වූ බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය. අමාත්‍යාංශය මගින් ඉහත සමාගමට නිවාස 10ක් ඉදිකිරීමට පවරා ඇත්තේ එම සමාගම මගින් සිදු කරන ලද යෝජනාවලියක් මගින් බවත්, නිවාස ලාභීන් තෝරාගැනීමද ඔවුන් විසින් සිදු කර ඇති බවත් සඳහන් විය.

## 2.5 ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් සැපයීම් හා සේවා ලබා ගැනීම

------------------------------------------------------------

2017 වර්ෂය සඳහා පාර්ලිමේන්තුව විසින් අනුමත කළ වාර්ෂික අයවැය ඇස්තමේන්තුවේ හා පරිපූරක අයවැය ඇස්තමේන්තු වෙන්කිරීම් මගින් පහත සඳහන් වැය විෂයයන්ට අදාළව සලසා ගෙන තිබුණු ප්‍රතිපාදන වියදම් කිරීම රජයේ ප්‍රසම්පදාන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු ව තිබුණි. අමාත්‍යාංශය විසින් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කරමින් සැපයීම් හා සේවා ලබා ගත යුතු වු රු. මිලියන 2,009.61 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර ඉන් රු.මිලියන 1,445.61 ප්‍රතිපාදන උපයෝජනය කර තිබුණි. ඒ අනුව රු. මිලියන 564 ක් හෙවත් සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 28.06 ක ප්‍රතිපාදන ඉතිරි කර තබුණි .

## 2.5.1 ප්‍රසම්පාදනයන් සැලැසුම් කිරීම

--------------------------------

අමාත්‍යාංශය වෙත සමාලෝචිත වර්ෂයේදී ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් සැපයීම් හා සේවා ඉටු කර ගැනීම සඳහා රු.මිලියන 2,009.61 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර, ඉන් රු.මිලියන 1,445.61 ක් උපයෝජනය කර තිබුණි. සලසා තිබුණු ප්‍රතිපාදනය සම්බන්ධයෙන් පිළියෙල කළ යුතු ප්‍රසම්පාදන සැලැසුම් පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

### (අ) ප්‍රසම්පාදන සැලැසුම් කිරීම සහ ප්‍රාරම්භක අවධිය

--------------------------------------------------------

සැලැසුම් හා ලියකියවිලි පරීක්ෂා කිරීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම නැත.

(ii) ප්‍රසම්පාදන පැකේජ සාරාංශය නැත.

(iii) ප්‍රාරම්භක ප්‍රසම්පාදන සැලැස්ම නැත.

(iv) හඳුනාගත් ප්‍රසම්පාදනයට අදාළව පවතින විශේෂ අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය ලියකියවිලි නැත.

(v) පිරිවිතර, සැලැසුම්, අඳිසටහන්, නිර්මිත යනාදිය සංවර්ධනය නැත.

**(ආ) පූර්ව කොන්ත්‍රාත් අදියරය**

-------------------------------

මෙම අදියර යටතේ පිළියෙල කළ යුතු ලියකියවිලි හා සැලැසුම් සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) එකිනෙක කොන්ත්‍රාත් පැකේජ සහා ප්‍රසම්පාදන කාල උපලේඛනය (ප්‍ර.කා.උ) නැත.
(ii) වැඩ, භාණ්ඩ සහ සේවා විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්ම නැත.
(iii) උපදේශන සේවා සඳහා විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් නැත.

**(ඇ) පශ්චාත් කොන්ත්‍රාත් (කොන්ත්‍රාත් පරිපාලනය) අදියරය**

-----------------------------------------------------------------

මෙම අදියර යටතේ පිළියෙල කළ යුතු ලියකියවිලි හා සැලැසුම් සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.
(i) කොන්ත්‍රාත් පරිපාලන සැලැස්ම (කො.ප.) නැත.
(ii) කොන්ත්‍රාත් පරිපාලන සැලැස්ම සමඟ බද්ධ වූ මුදල් ගලායැම් සැලැස්ම නැත.

**2.5.2 ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරිම**

-----------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැවිලි මානව සංවර්ධන භාරය මගින් ඉටුකරනු ලබන ව්‍යාපෘති සම්බන්ධයෙන් අමාත්‍යාංශයේ පවතින කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(i) වැවිලි මානව සංවර්ධන භාරය මගින් ඉටු කරනු ලබන සියලුම කොන්ත්‍රාත් ඉදිකිරීම් සඳහා අමාත්‍යාංශය වෙනුවෙන් වතු සේවක නිවාස සමුපකාර සමිති සමඟ ගිවිසුම් ගත වී ඉදිකිරීම් කරනු ලබයි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශණයේ හා ප්‍රසම්පාදන මඟ පෙන්වීමේ 3.9.4 ඡේදය ප්‍රකාරව සමුපකාර සමිති වෙත එකතුව රු. මිලියන 2 කට වඩා වැඩි කොන්ත්‍රාත් නොදිය යුතු අතර නිශ්චිත කාලයක් තුල සමිතියක් විසින් ඉටු කරනු ලබන මුළු කොන්ත්‍රාත් සංඛ්‍යාව තුනකට නොවැඩි විය යුතුය. එසේ වුවද ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ දක්වා ඇති සීමාවන් ඉක්මවා ඒ ඒ වතු සමිති වලට අදාල සියළුම ඉදිකිරීම් එම සමිති වලට ලබාදීමත් එම සමිති මගින් ප්‍රසම්පාදන මඟ පෙන්වීමේ 3.9.1 ට පටහැනිව උප කොන්ත්‍රාත් ලබාදීමත් නිරීක්ෂණය විය. තවද පෞද්ගලික ආයතනයක් වන වැවිලි මානව සංවර්ධන භාරය අමාත්‍යාංශය වෙනුවෙන් කොන්ත්‍රාත් ඉදිකිරීම් සඳහා ගිවිසුම් ගත වන අතර එසේ කිරීමට ලබාගත් අනුමැතියක් විගණනයට ඉදිරිපත් නොවීය.

(ii) ග්‍රීන් ගෝල්ඩ් නිවාස ව්‍යාපෘතිය යටතේ මහනුවර හා මාතලේ දිස්ත්‍රික්ක තුල 2017 වර්ෂය තුලදී නිවාස ඒකක 329 කින් සමන්විත නිවාස ව්‍යාපෘති 18ක් වෙනුවෙන් රු. මිලියන 329 ක් හා ඒ සඳහා වන කළමණාකරණ ගාස්තු වශයෙන් රු. මිලියන 19.7 ක් වෙන් කර 2017 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 173.7ක් ගෙවා තිබුණු අතර රු. මිලියන 155.2 ගෙවීමටද(බැරකමක්) තිබුණි. ඒ සඳහා කළමණාකරණ ගාස්තුවෙන් රු. මිලියන 7.5ක් ගෙවා තිබුණි. මෙම නිවාස යටතේ භෞතික පරීක්ෂණයෙන් නිවාස ඒකක 106 කින් සමන්විත නිවාස ව්‍යාපෘති 6ක් සඳහා වැය කල රු.මිලියන 100.5 ඉදිකිරීම් පරීක්ෂාවට ලක් කර ඇත. පරීක්ෂා කල නිවාස වලට භාවිතා කරන ලද අමු ද්‍රව්‍ය ප්‍රමිතියෙන් තොර, ගුණාත්මක තත්වයෙන් පහළ මට්ටමක පවතින ඒවා වන අතර නුපුහුණු ශ්‍රමිකයන් ඉදිකිරීම් කටයුතු වලට යොදාගෙන ප්‍රමිතියෙන් තොරව ඉදිකර තිබුණි.

(iii) පෙර නිමි කොන්ත්‍රාත් ක්‍රමය යටතේ නිම කිරීම සඳහා නියමු ව්‍යාපෘතියක් ලෙස නිවාස 50 ක් රු.මිලියන 50 කට ඉදිකිරීමට අමාත්‍යාංශයේ වැවිලි මානව සංවර්ධන භාරය වෙත ලබා දී තිබුණද එම ව්‍යාපෘතිය ඉදිකිරීම, ට්‍රැන්ඩන් වතුයාය වතු සංගමයට අයත් වතු සමූපකාර සමිතිය වෙත වැවිලි මානව සංවර්ධන භාරය විසින් ලබා දී තිබුණි. එම වතු සංගමය විසින් රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලියට නැවත උපකොන්ත්‍රාත්තුවක් ලෙස 2016 දෙසැම්බර් 09 දින ලියාපදිංචි කරන ලද ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව ලබා දී තිබුණි.

(iv) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 ඡේදය අනුව රු.250,000 ක් ඉක්මවන ඕනෑම වැඩ කොන්ත්‍රත්තුවක් සඳහා ලිඛිත කොන්ත්‍රාත් ගිවිසුමකට ඇතුළත් විය යුතු වුවත් කොන්ත්‍රාත්තුව පිරිනැමීම හා මේ දක්වා කටයුතු ඇතුලත් කිරීමට අවශ්‍ය මූලික ගිවිසුමක් අමාත්‍යාංශය හා ඉහත පුද්ගලික සමාගම අතර හෝ වැවිලි මානව සංවර්ධන භාරය හා එම සමාගම අතර තිබුණු බවට සාක්ෂි ඉදිරිපත් නොවිය.

(v) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.12.1 (අ) මාර්ගෝපදේශයට අනුව ගෙවීම් සිදු කිරීමේ කාර්යය සඳහා ව්‍යාපෘතිවල කාර්යය සඳහා ව්‍යාපෘතිවල කොන්ත්‍රාත්වලට අදාල සියළුම කටයුතු අධීක්ෂණය කරන බවටත් තක්සේරු කරන බවටත්, සහතිකවීම සඳහා ප්‍රසම්පාදන අස්ථිත්වය (අමාත්‍යාංශය) වගකිව යුතු අතර භාර ගැනීමට පෙර සපයා ඇති සේවාවල ද ඉටුකර ඇති වැඩවල ගුණාත්මක භාවයද ස්වාධීනව පරීක්ෂාකර බැලිය යුතුය. එසේ වුවද වැවිලි මානව සංවර්ධන භාරය මගින් ඉටුකරනු ලබන ව්‍යාපෘතිවල කොන්ත්‍රාත් වලට අදාල ඇස්තුමේන්තු සහතික කරගැනීමේ කටයුතු හැර උපදේශන සේවා සැපයීම, කොන්ත්‍රාත් කරුවන් තෝරා ගැනීම, අධීක්ෂණය, මුදල් ගෙවීම ආදිය සම්බන්ධයෙන් එසේ සිදු නොවන බව නියැදි පරීක්ෂණ අනුව නිරීක්ෂණය විය.

- ❖ කොටියාගල නිවාස 184 ක් ඉදිකිරීම සඳහා ටෙන්ඩරය ප්‍රධානය කිරීමේ දී කොන්ත්‍රාත්කරුගේ පූර්ව සුදුසුකම් පරීක්ෂා කිරීමකින් තොරව හා හතරවන අවම මිල ඇගයීමටද නොගෙන විනිවිදභාවයෙන් තොරව පස්වන අවම මිල ඉදිරිපත් කල කොන්ත්‍රාත්කරු තෝරාගෙන 2016 මැයි 23 දින කොන්ත්රාත්කරු සමඟ එළඹී ගිවිසුම සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

- ❖ ගිවිසුමේ ආරම්භ හා අවසන් දිනයන් පිළිබඳව සඳහන් කර නොතිබුණි.

- ❖ කොන්දේසි කිසිවක් සඳහන් කර නොතිබුණ අතර කොන්දේසි හැරුණුවිට ගන්නා ලද ක්‍රියා මාර්ගද සඳහන් කර නොතිබුණි.

- ❖ ගිවිසුමේ වටිනකම සඳහන් කර නොතිබුණි.

- ❖ ප්‍රමාද ගාස්තු සම්බන්ධයෙන් කිසිවක් සඳහන් කර නොතිබුණි.

(ආ) නුවරඑළිය දිස්ත්‍රික්කයේ 2014 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා සිදුකරන ලද ඉදි කිරීම් වලින් රු.මිලියන 1,392.73 ක් වටිනා නිවාස හා රු.මිලියන 23.30 ක් වටිනා යටිතල පහසුකම් සැපයීම පිළිබඳව භෞතික පරීක්ෂාවන් සිදු කිරීමේදී නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(i) වතු සමිති මගින් උප කොන්ත්‍රාත් ලබාදුන් ආයතනවල කර්මාන්ත නිම කිරීමේ හැකියාව පිළිබඳව වැවිලි මානව සංවර්ධන භාරය විසින් පරීක්ෂා කිරීමක් සිදු කර නොමැති අතර, ඉදිකිරීම් හා පුහුණු සංවර්ධන ආයතනයේ ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් වෙත ලබාදිය යුතු කොන්ත්‍රාත් ප්‍රමාණවත් හැකියාවක් නොමැති කොන්ත්‍රාත්කරුවන් විසින් හා කොන්ත්‍රාත්කරුවකු ලෙස ලියාපදිංචියක් හෝ නොමැති පුද්ගලයන් විසින් ඉටු කරනු ලබන බව ක්ෂේත්‍ර පරීක්ෂණවලදී අනාවරණය විය.

(ii) ඇස්තමේන්තු හා කර්මාන්ත ක්ෂේත්‍රයේ පවතින සම්මත ගොඩනැගිලි රේට අතර විශාල වෙනස්කම් පවති. " ග්‍රීන් ගෝල්ඩ් හවුසින් " ව්‍යාපෘති සැලසුමට අදාල වැවිලි මානව සංවර්ධන භාරයේ ඇස්තමේන්තුව නුවරඑළිය දිස්ත්‍රික්කය තුල පවතින ගොඩනැගිලි සම්මත රේටයන්වලට සැකසූ ඇස්තමේන්තුව වැවිලි මානව සංවර්ධන භාරයේ ඇස්තමේන්තුවට වඩා සියයට 30 කින් ඉහළ බව නිරීක්ෂණය විය.

(iii) වැවිලි මානව සංවර්ධන භාරය විසින් සමුපකාර සමිති සමඟ ගිවිසුම්ගතවී අමාත්‍යාංශයේ ව්‍යාපෘති එම සමුපකාර සමිති වලට පවරා ඇති අතර සමුපකාර සමිති විසින් කොන්ත්‍රාත් හැකියාව පරීක්ෂා කිරීමකින් තොරව උප කොන්ත්‍රාත් ලබාදී තිබේ. ඒ අනුව වසරකට මිලියන දහසකට අධික ව්‍යාපෘති ප්‍රසම්පාදන ක්‍රමවේදයෙන් බැහැරව කොන්ත්‍රාත්කරුවන්ට ලබාදීම නිරීක්ෂණය විය.

(iv) සියලුම ව්‍යාපෘති ඉටු කිරීමට පෙර ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ නිර්දේශය ලබාගත්තද එහි නිර්දේශ අනුව ක්‍රියාකර ඇතැයි විගණනයේදී සෑහීමකට පත්විය නොහැකි විය. තවද නිවාස ඉදිකිරීමෙන් පසු පදිංචියට පෙර ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ නිර්දේශ අනුව ඉදිකිරීම් කල බවට අනුමැතිය ලබාගත යුතු නමුත් එසේ අනුමැතිය ලබාගත් බවට සාක්ෂි ඉදිරිපත් නොවීය.

## 2.6 වත්කම් කළමනාකරණය

----------------------------

අමාත්‍යාංශයේ වත්කම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

### (අ) වාහන උපයෝජනය

-----------------------

(i) අමාත්‍යාංශය වෙත සමාලෝචිත වර්ෂය අවසන් වන විට වාහන 122 ක් හා යතුරුපැදි පැවති අතර ඉන් අමාත්‍යාංශය සතු වාහන 30 ක් පමණක් වන අතර වාහන 3ක් කුලීපදනම මතද ඉතිරි වාහන 89 ක් තොන්ඩමන් අනුස්මරන පදනමට හිමිවේ. ඉහත වාහන 122න් වාහන 13ක් අමාත්‍යාංශය විසින් වෙන්කල වාහන ලෙසද, තොන්ඩමන් අනුස්මරන පදනම සතු යතුරුපැදි 84ක් සම්බන්ධීකරණ නිලධාරීන් වෙතද වෙන්කර භාවිතා කරනු ලබයි. ඒ අනුව ඉතිරි වාහන 25 න් වාහන 03ක් වර්ෂය පුරාම හා එක් වාහනයක් මාස 10 ක් ද ධාවන තත්වයෙන් තොරව පැවති අතර ඉතිරි වාහන 21 ක් සංචිත වාහන ලෙස භාවිතා කරනු ලබයි. එම වාහන 21 න් වාහන 4 ක් සඳහා වර්ෂය පුරාමද වාහන 2ක් සඳහා මාස 9 ක් හා මාස 6ක් ද අතර ධාවන සටහන් ලැබී නොමැත.

(ii) අමාත්‍යාංශය වෙත සමාලෝචිත වර්ෂය අවසන් වන විට වාහන 122 ක් පැවැති අතර, එම වාහන වලින් විගණනයට තොරතුරු ලද වාහන 27 ක් (කල්බදු වාහන හැර) සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි කිලෝ මීටර් 532,998 ක් ධාවනය කර තිබුණු අතර, ධාවන තත්වයේ

සංචිත වාහන 19 ක් (කල්බදු වාහන 2ක් හැර ) සඳහා ඉන්ධන හා ලිහිසි තෙල් සඳහා රු.මිලියන 1.94 ක්ද, වාහන 25ක් සේවා කිරීම සඳහා රු.මිලියන 11 ක් ද, අළුත්වැඩියා සඳහා රු.මිලියන 9.96 ක්ද හා රක්ෂණය කිරීම සඳහා රු.මිලියන 2.06 ක්ද වශයෙන් එකතුව රු.මිලියන 24.96 ක් වැය කර තිබුණි. ඉතිරි වාහන 12 සම්බන්ධ ඒ අනුව අමාත්‍යාංශය විසින් වාහන ධාවනය කිරීම සඳහා රියදුරු වැටුප් හා දීමනා හැර කිලෝ මීටරයක් සඳහා රු. 47 ක් වැය කර තිබුණි.

| | වාහන වර්ගය | වාහන ගණන | වටිනාකම | රියදුරු වැටුප් හා දීමනා හැර අනෙකුත් වියදම් | ධාවනය කළ කිලෝමීටර් ගණන | ධාවනය කළ කිලෝ මීටරයක් සඳහා වියදම |
|---|---|---|---|---|---|---|
| | ---------- | ------ | ----------- | ---------------- | ---------------- | ----------------- |
| | | | රු. | රු. | රු. | රු. |
| 01 | ජීප් රථ | 8 | 101,100,000 | 7,787,000 | 233,712 | 33 |
| 02 | කාර් රථ | 8 | 22,080,000 | 3,093,541 | 106,349 | 29 |
| 03 | කැබ් රථ | 9 | 37,270,000 | 14,029,508 | 187,468 | 75 |
| 04 | යතුරු පැදිය | 2 | 399,000 | 45,820 | 5,469 | 8 |
| | **එකතුව** | **27** | **173,689,000** | **24,955,869** | **532,998** | **47** |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i) අළුත්වැඩියා කිරීම්**

-----------------------

2017 ජනවාරි මස 01 දින වාහන වාර්තාව අනුව රු.මිලියන 4.5 ක වටිනාකමකින් යුතු ජීප් රථයක් හා රු. මිලියන 2.4 ක වටිනාකමකින් යුතු කාර් රථයක් පිළිවෙලින් 2016 ජනවාරි 06 දින හා 2017 මාර්තු 03 දින සිට 2018 ජුලි 26 දින දක්වාම අළුත්වැඩියා කිරීමෙන් තොරව නිෂ්ක්‍රීයව පවතින බව නිරීක්ෂණය විය.

**(ii) වෙනත් නිරීක්ෂණ**

-------------------

- 2017 ජුනි 28 දිනැති අංක 1/2017 දරණ වත්කම් කළමණාකරණ චක්‍රලේඛය ප්‍රකාරව කොන්ට්‍රොල් ජෙනරාල් කාර්යාලය වෙත වත්කම් සම්බන්ධව තොරතුරු යැවීමේදී අමාත්‍යාංශය වෙත පවරා ගෙන ඇති හා වියදම් දරා ඇති සෞම්‍ය මූර්ති අනුස්මරණ පදනම යටතේ ඇති වාහන 91 ක් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර නොමැති අතර විගණනය සඳහා පදනම ඉදිරිපත් කල වාහන පිළිබඳ තොරතුරු වල, සෞම්‍යමූර්ති තොණ්ඩමන් අනුස්මරණ පදනම යටතේ පවතින වාහන 88ක් සම්බන්ධයෙන් තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි.

- මුදල් රෙගුලාසි 756 සහ 757 ප්‍රකාරව වාහන සම්බන්ධව වාර්ෂික භෞතිකව සමීක්ෂණයක් පැවැත්විය යුතු වුවද, වාහන පිළිබඳ සමීක්ෂණයක් සිදු කර නොතිබුණි.

(ආ) **මූල්‍ය හා මෙහෙයුම් කල් බදු ක්‍රමය යටතේ වාහන උපයෝජනය**

අමාත්‍යාංශය විසින් මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ වාහන 03 ක් ලබා ගෙන තිබුණු අතර, ඒ සඳහා කල්බදු වාරික වශයෙන් රු.මිලියන 1.02 ක්ද, ඉන්ධන හා ලිහිසි තෙල් සඳහා රු. 99,067 ක්ද, කල්බදු ක්‍රමය යටතේ ලබාගත් වාහනවලින් කිලෝමීටර් 5,759 ක් ධාවනය කර තිබුණි. ඒ අනුව එම වාහනවලින් එක් කිලෝමීටරයක් ධාවනය කිරීම සඳහා රු. 193 ක් වැය කර තිබුණි. විස්තර පහත දැකවේ.

| | **වාහන වර්ගය** | **වාහන ගණන** | **වාර්ෂික කල්බදු වාරික වටිනාකම** | **රියදුරු වැටුප් හා දීමනා හැර අනෙකුත් වියදම්** | **ධාවනය කළ කිලෝමීටර් ගණන** | **ධාවනය කළ කිලෝ මීටරයක් සඳහා වියදම** |
|---|---|---|---|---|---|---|
| | | | රු. | රු. | රු. | රු. |
| 01 | වෑන් රථය | 01 | 1,019, 400 | 99,067 | 5,759 | 193 |
| 02 | ඩබල් කැබ් | 02 | 2,275,831 | - | - | - |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) අමාත්‍යාංශය විසින් ඇතිකර ගත් මෙහෙයුම් කල්බදු ගිවිසුමක් ප්‍රකාරව වෑන් රථය සඳහා මාසිකව කි.මී 3000 ක් ධාවනය කිරීමට මසකට රු169,900 ක (වැට් රහිතව) අවමයකට යටත්ව හා වැඩිවන එක් කිලෝමීටරයක් සඳහා රු. 20 ක් (වැට් රහිතව) වන ලෙස ගෙවීමට 2017 ජූලි 07 දින එකඟවී තිබුණි. ඒ අනුව ජූලි සිට දෙසැම්බර් දක්වා මාස හයට ධාවනය විය යුතු අවම කිලෝමීටර ගණන වන කි.මී 18,000 ක් වෙනුවට මාසිකව කි.මී. 355 සිට 1,541 ක් දක්වා පරාසයක වන ලෙස මාස 6 කට එකතුව කි.මී 5759 ක් පමණක් ධාවනය කර රු.1,019, 400 ක් ගෙවා තිබුණි. ඒ අනුව එම රථය කිලෝ මීටරයක් ධාවනය කිරීම සඳහා රු 177 ක් ඉන්ධන වියදමට අමතරව වැය කර තිබුණි.

(ii) අමාත්‍යාංශය විසින් මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ ලබා ගෙන තිබුණු ඩබල් කැබ් රථ දෙක 2017 වර්ෂය තුල ධාවනය කළ කිලෝමීටර ගණන පිළිබඳ තොරතුරු අමාත්‍යාංශය සතුව නොමැති බව විගණනය වෙත දන්වා ඇත.

(ඇ) **කාර්යාල පවත්වා ගැනීමේ වියදම්**

අමාත්‍යාංශය සතු ගොඩනැගිලි 01 ක් වන අතර, වාර්ෂිකව රු.මිලියන 31.67 කුලියක් මත ලබාගත් ගොඩනැගිල්ලක කාර්යාලය පවත්වා ගෙන යනු ලබයි. වාර්ෂික පිරිසිදු කිරීමේ ගාස්තුව රු.මිලියන 2.98 ක් වන අතර ආරක්ෂක සේවා ගාස්තුව රු.මිලියන 1.92 කි. ඒ අනුව මුළු ගොඩනැගිල්ල වෙනුවෙන් වූ වියදම රු.මිලියන 36.57 ක් වී තිබුණි. ඒ අනුව ඒක පුද්ගල කාර්යාලය පවත්වා ගෙන යාමේ වියදම රු.මිලියන 36.57 ක් වී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) අමාත්‍යාංශය පිහිටි ගොඩනැගිල්ල සඳහා ආරක්ෂක සේවා සඳහා පැමිණීමේ ලේඛනයක් පවත්වාගෙන තිබුණත් එම ලේඛනය සෑම විටම පාලන අංශය යටතේ දෛනිකව අධීක්ෂණය කළ යුතු නමුත් පැමිණීමේ නාම ලේඛණය ස්ථාන භාර ආරක්ෂක නිලධාරියා භාරයේ පවතින බවත් ගෙවීම් සිදුකිරීම සඳහා එම පැමිණීමේ ලේඛණය අමාත්‍යාංශය විසින් ප්‍රයෝජනයට ගන්නා බවත් අනාවරණය විය. මේ අනුව ඉතා දුර්වල පාලනයක් මේ සම්බන්ධව පවතින බව නිරීක්ෂණය විය

(ii) පිරිසිදු කිරීම් සේවා ප්‍රසම්පදන ක්‍රියාවලියේදී තෝරා ගත් ආයතනයෙහි අයදුම්පතෙහි පැවති ගණනය කිරීම් දෝෂය නිවරදි නොකිරීම හේතුවෙන් ගිවිසුමට එළඹීමේදී ගිවිසුම් වටිනාකම මාසිකව රු.1,132 ක් වැඩිපුර ගෙවීම සඳහා ගිවිසුම්ගතවී තිබුණි. එම නිසා 2016 අප්‍රේල් මාසයේ සිට 2017 ජූලි මාසය දක්වා රු.16,983 වැඩිපුර ගෙවා ඇති බව නිරීක්ෂණය විය. පිරිසිදු කිරීම් සේවාවේ කාර්යමණ්ඩල පැමිණීම් පිටවීම් සම්බන්ධව දුර්වල පාලනයක් පවතින බවත් මාස තුනක් සඳහා ඇඟිලි සළකුණු වාර්තා හා පැමිණීමේ ලේඛණය අනුව මාස තුනක නියදිය සඳහා ගිවිසුමට පටහැනිව රු.49,474 ක් වැඩිපුර ගෙවා ඇති බව නිරීක්ෂණය විය.

**(ඇ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

**-----------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2017 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා චක්‍රලේඛයේ 3.2.6 ඡේදය ප්‍රකාරව 2018 ජූනි 15 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, අමාත්‍යාංශය විසින් එම වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කලේ 2018 අගෝස්තු 27 දිනය.

(ii) සෞම්‍ය මූර්ති අනුස්මරණ පදනම යටතේ ක්‍රියාත්මකව පැවති පූල් බෑන්ක් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, රම්බොඩ සංස්කෘතික මධ්‍යස්ථානය, නෝර්වුඩ් ක්‍රීඩා සංකීර්ණය, හා ප්‍රජා ශක්ති මධ්‍යස්ථානය යන ආයතන හතරේ චංචල හා නිශ්චල දේපළ සියල්ල අමාත්‍යාංශය යටතට පැවරීමට 2016 ජූනි 29 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාදී ඇති නමුත් භාණ්ඩ සමීක්ෂණය කර එම වත්කම් නිසියාකාරව පවරා ගැනීමටත්, මුදල් රෙගුලාසි 755 (1) හා (2) ප්‍රකාරව වාර්තා සකස්කර ඉදිරිපත් කිරීමටත්, 2018 අප්‍රේල් 12 දින දක්වාම කටයුතු කර නොතිබුණි. උක්ත කරුණු හේතුවෙන් 2017 ජූනි 28 දිනැති අංක 1/2017 දරණ වත්කම් කළමණාකරණ චක්‍රලේඛය ප්‍රකාරව කොන්ට්‍රෝල් ජනරාල් කාර්යාලය වෙත වත්කම් සම්බන්ධව යැවූ තොරතුරු පරීක්ෂාවේදී අමාත්‍යාංශය විසින් මෙම ආයතන හතරට අයත් වත්කම් ඉදිරිපත් කර නොමැත.

**(ඉ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්**

**---------------------------------------------**

අමාත්‍යාංශ ගොඩනැගිල්ලේහි බිම් මහලේ පිහිටි අමාත්‍යාංශය සතු කිරිහල සහිත ගොඩනැගිල්ල අමාත්‍යාංශයේ සුභසාධක අංශය විසින් ගිවිසුමකට එළඹීමකින් තොරව බාහිර පාර්ශයකට බදු දී තිබූ අතර ඒම කිරිහලේ විදුලි හා ජලය සඳහා වූ වියදම අමාත්‍යාංශය විසින් වැය කරන බව නිරීක්ෂණය විය.

## 2.7 බැදීම් හා බැරකම්

--------------------

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) වාර්ෂික අයවැය සීමාව ඉක්මවා බැදීම්වලට එළඹීම**

-----------------------------------------------------

(i) මෙහෙයුම් වැඩසටහන් යටතේ වැය දැරීම සඳහා අමත්‍යාංශය බාහිර ආයතන සමඟ ඇතිකරගෙන තිබූ ගිවිසුම් වලට අනුව බැදීම් ලෙස දැක්විය යුතු කුලී පිට ගත් වාහන 03 කට, ආරක්ෂක සේවා ලබා ගැනීමට හා පිරිසිදු කිරීමේ සේවා ලබා ගැනීමට එළඹෙන ලද බැදීම් වටිනාකම හා වර්ෂය සඳහා වූ එකතුව රු.මිලියන 15.09 ක් වූ බැදීම් පදනම් කර ගෙන එළඹ ඇති බැරකම් ප්‍රමාණයත් ඒ අනුව වර්ෂය අවසානයේ බැදීම් වටිනාකම විසර්ජන ගිණුම තුළ දක්වා නොමැති බව නිරීක්ෂණය විය.

(ii) අමාත්‍යාංශයේ විසර්ජන ගිණුමේ සංවර්ධන වැඩ සටහන් යටතේ බැරකම් හා බැදීම් ඇතිවීමට හේතුව ලෙස "වර්ෂය අවසානයේ ගිවිසුම්ගත වීම" ලෙස දක්වා තිබූ නමුත් පහත දැක්වෙන බැරකම් වලට අදාල බැදීම් සඳහා ගිවිසුම් වලට එළඹ නොතිබුණි. තවද ශේෂයන්හි නිවැරදිතාවය පරික්ෂා කිරීම ට ප්‍රමාණවත් සාක්ෂි ලෙස පොත්පත්( කොන්ත්‍රාත් ලේඛන, බැරකම් ලේඛන) ඉදිරිපත් නොවිණි.

(iii) අමාත්‍යාංශය බාහිර ආයතන සමග ඇති කරගෙන තිබූ මෙහෙයුම් වැඩසටහන්වලට අදාළව විගනණයට ඉදිරිපත් නොකරන ලද ගිවිසුම්ද පැවති අතර ඒවායේ වටිනාකම බැදීම් ලෙස විසර්ජන ගිණුමේද දක්වා නොතිබුණි. (උදාහරණ -: ගොඩනැගිලි සේවා ගිවිසුම, වායුසමීකරණ යන්ත්‍ර සේවා ගිවිසුම) නමුත් ගොඩනැගිලි සේවා ගිවිසුමට අදාල 2017 වර්ෂයට අදාල බැරකමක් වන රු.2639,250 ක් පමණක් ගිණුමේ බැදීම් ලෙස දක්වා තිබුණි.

**(ආ) බැරකම් වැඩියෙන් සටහන් කිරිම**

-----------------------------------

(i) අමාත්‍යාංශය විසින් ඊස්ට් ලංකා පුද්ගලික සමාගම් දෙකක් සමග පිළිවෙලින් 2016 මැයි 23 හා 2016 අප්‍රේල් 20 දිනයන්හිදී එකතුව රු.මිලියන 212.96 ක් සඳහා ගිවිසුමකට එළඹ ඇති අතර 2016 වර්ෂය තුලදී ඉන් රු.මිලියන 83.61 පමණක් ගෙවා තිබුණි. ඒ අනුව 2017 වර්ෂය තුල ඇති බැදීම රු.මිලියන 129.36 ක් වියයුතු නමුත් විසර්ජන ගිණුමේ මෙම ගිවිසුම් දෙක යටතේ රු.මිලියන 151.30 ක බැරකමක් දක්වා තිබුණි. ඒ අනුව එක් පුද්ගලික සමාගම සඳහා ගිවිසුම ඉක්මවා රු.මිලියන 11.29 ක් හා අනෙක් පුද්ගලික සමාගම සඳහා ගිවිසුම ඉක්මවා රු.මිලියන 10.65 ක් බැරකම් ලෙස දක්වා තිබුණි.

(ii) අමාත්‍යාංශය මගින් ගෙවිය යුතුව තිබුණු වැය විෂයයන් 2 කට අදාළව රු.මිලියන 3.24 ක්වූ බැරකම් විසර්ජන ගිණුමේ සටහන් කර නොතිබුණු අතර මුදල් රෙගුලාසි 94(1) ට පටහැනිව ප්‍රතිපාදන ඉක්මවා බැරකම් වලට බැදීම වැය විෂයයන් 7 කට අදාළව රු.මිලියන 5.56 ක් වී තිබුණි.

## 2.8 අවිධිමත් ගනුදෙනු

--------------------

අමාත්‍යාංශය විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොරවිය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

### (අ) මුදල් රෙගුලාසි 139 ප්‍රකාරව ගෙවීම් කිරීම සිදු නොකළ ගනුදෙනු

--------------------------------------------------------------------

(i) වතු නිවාස සංවර්ධන වැඩසටහන යටතේ 2017 වර්ෂයට පෙර සිදුකරණ ලද සියළුම නිවාස ඉදිකිරීම් කිසිදු ගිවිසුමකට හෝ ඇතුලත් නොවී වැවිලි මානව සංවර්ධන භාරය වෙත ලබාදී තිබූ අතර ඔවුන් විසින් වතු සමූපකාර සමිති හරහා වෙනත් ආයතන සමග උප කොන්ත්‍රාත් ලබාදී ඉදිකිරීම් කර ඇත. එසේ වුවද අමාත්‍යාංශය විසින් චෙක්පත් නිකුත් කරනු ලබන්නේ වැවිලි මානව සංවර්ධන භාරය නමින් බව නිරීක්ෂණය විය. එම ඉදිකිරීම් සඳහා 2017 වර්ෂය තුලදී වැවිලි මානව සංවර්ධන භාරය වෙත නව ජීවන හා ග්‍රීන් ගෝල්ඩ් නිවාස වැඩසටහන සඳහා රු.මිලියන 1,346. 50 ක් ගෙවීම් කර ඇත. මෙම ගෙවීම් සියල්ල ලද බවට අදාල පාර්ශවයන් විසින් ඉදිරිපත් කල රිසිට්පත් නොමැති බව නිරීක්ෂණය විය.

(ii) වැවිලි මානව සංවර්ධන භාරය මගින් වතු සේවක නිවාස සමූපකාර සමිති යටතේ උපකොන්ත්‍රාත් ලබා දුන් ඉදිකිරීම් සඳහා නිවාස ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අමාත්‍යාංශය ඉදිරිපත් කල ප්‍රගති වාර්තාව අනුව නිවාස ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන ඉක්මවා රු.මිලියන 1.17 ගෙවීම් කර ඇති බව නිරීක්ෂණය විය.

(iii) පෙර නිමි කොන්ක්‍රීට් ක්‍රමය යටතේ නිවාස ඉදිකිරීම ව්‍යාපෘතිය යටතේ 2017 ජූනි 14 දිනැති වැවිලි මානව සංවර්ධන භාරය හා වතු අධිකාරිය අතර අත්සන් කරන ලද ලියවිල්ල (සංකල්ප කඩදාසිය) ප්‍රකාරව ව්‍යාපෘතියේ ආරම්භක දිනය 2017 මැයි 17 ද අවසන් කල යුතු දිනය 2017 නොවැම්බර් 16 දිනද වේ. නමුත් 2017 දෙසැම්බර් 21 දින වන විට මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් ඇස්තමේන්තු කරන ලද රු.මිලියන 50 න් අමාත්‍යාංශය විසින් වැවිලි මානව සංවර්ධන භාරය වෙත රු.මිලියන 33 ක් ගෙවා තිබුණි. නමුත් 2017දෙසැම්බර් 31 දින වන විට කිසිදු නිවසක් නිමකර ලබාදී නොතිබුණි.

### (ආ) ප්‍රතිලාභීන්ගෙන් ණය නැවත අයකර ගැනීම හා භාණ්ඩාගාරයට බැර කිරීම නිසි පරිදි සිදු නොකිරීම

--------------------------------------------------------------------------------------------

(i) 2016 දෙසැම්බර් 31 දක්වා වූ නිවාස ඉදිකිරීම් මගපෙන්වීම් හී 9.2 ඡේදය ප්‍රකාර අයකරන මුදල සෑම මසකම නිසියාකාරව අයකර එවීම වතු අධිකාරිත්වයේ හා වතු සේවක නිවාස සමූපකාර සමිතියේ වගකීම වන බව හා එම මුදල් මාසිකව ගෙන්වා ගෙන ඊළඟ මස 15 දිනට පෙර රජයේ ඒකාබද්ධ අරමුදලට බැරකිරීම පිණිස සෘජුවම අමාත්‍යාංශය වෙත එවිය යුතු වන බව දක්වා ඇති නමුත්, ණය ලබාදීම සඳහා සෘජුවම සම්බන්ධ වන්නේ හා ණය ආධාර ලාභීන් තෝරා ගැනීම සිදු කරන්නේ වැවිලි මානව සංවර්ධන භාරය වන බැවින් හා ඉහත ආයතන නිසිපරිදි දැනුවත්කර නොතිබුණි. එසේ අයකරගත් ණය මුදල් වැවිලි මානව සංවර්ධන භාරය වෙතට එකතුකර ගන්නා බව නිරීක්ෂණය විය. වැවිලි මානව සංවර්ධන භාරයේ වාර්ෂික වාර්තාවේ අවසන් ගිණුම් අනුව එසේ ණය එකතුකර අමාත්‍යාංශයට නොගෙවූ 2015 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 30.85 ක් හා 2016

දෙසැම්බර් 31 දිනට රු.මිලියන 37.75 ක්ද 2017 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 33.25 ක ශේෂයන් විය. පසුගිය වර්ෂයේදීද අමාත්‍යාංශයට නොගෙවූ මුදල් පිළිබද අප විසින් පෙන්වා දුන් නමුත් 2016 හා 2017 වර්ෂයන්හි අමාත්‍යාංශයට අයකරගත හැකිවී ඇත්තේ පිළිවෙලින් රු.මිලියන 7.59 ක් හා රු.මිලියන 7.47 ක් පමණක් බව නිරීක්ෂණය විය. ඒ අනුව රජයේ මුදල් අවභාවිතා වන බව නිරීක්ෂණය කෙරේ.

(iii) ණය අයකර ගැනීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ සංවර්ධන විසින් ලබාදුන් වාර්තාවට අනුව 2015 වතු වලින් රු.958,405 ක් ද නිවාස අරමුදලේ චෙක්පත් මගින් රු.975,820 ක්ද 2016 වතු වලින් රු.649,613 ක්ද 2017 වතු වලින් රු.මිලියන 9.20 නිවාස අරමුදල චෙක්පත් මගින් රු.මිලියන 1.26 ක්ද අයකරගත් ණය මුදල් නැවත අමාත්‍යාංශයට නොගෙවීම හේතුවෙන් අමාත්‍යාංශය විසින් වැවිලි මානව සංවර්ධන භාරයට ගෙවිය යුතු කළමනාකරණ ගාස්තු රු.මිලියන 17.11 ක් 2017 වර්ෂයේදී හිළව්කර ගත් බව ද දක්වා ඇත. ඒ අනුව 2017 දෙසැම්බර් 31 දිනට අයවී ඇති මුළු ණය ශේෂය රු.මිලියන 30.15 වේ. එදිනට මහා භාණ්ඩාගාරයට එම මුළු මුදලම බැර කලයුතුය. නමුත් ණය අයකර මහා භාණ්ඩාගාරයට 2015 වර්ෂයේ සිට 2017 දෙසැම්බර් 31 දින දක්වා බැර කර ඇත්තේ රු.මිලියන 17.62 ක් පමණි. ඒ අනුව ඉතිරි රු.මිලියන 12.53 ක වටිනාකම පොදු තැන්පත් ගිණුමේ හෝ නොමැති බැවින් හිළව්කර ගත් කළමණාකරන ගාස්තු ශේෂය වියදමක් ලෙස හා ආදායමක් ලෙස නිවැරදිව ගිණුම්ගතවී නොමැති බව නිරීක්ෂණය විය.

(iii) නව ජීවන වතු නිවාස සංවර්ධන වැඩසටහන යටතේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අදාලව 2017 වර්ෂයට පෙර පැවති මග පෙන්වීම් අත්වැලෙහි 9.2 ඡේදය යටතේ ප්‍රතිලාභීන් ගෙන් ණය මුදල් ආපසු අයකිරීම වතු නිවාස ව්‍යාපෘති ආරම්භකර තෙවන මාසයේ සිට ආරම්භ කල යුතු ලෙස දක්වා ඇති නමුත්, 2011 වර්ෂයේ සිට 2017 වර්ෂය ආරම්භය දක්වා නව ජීවන වතු නිවාස සංවර්ධන වැඩසටහන යටතේ හා ග්‍රීන් ගෝල්ඩ් ව්‍යාපෘතිය යටතේ රු.මිලියන 442.94 ක් ගෙවා ඇති අතර ඉන් ණය නැවත අය කරගත යුතු ප්‍රමාණය නව ජීවන වතු නිවාස සඳහා රු.මිලියන 232.24 ක් හා ග්‍රීන් ගෝල්ඩ් සඳහා රු.මිලියන 4.11 ක් වන ලෙස අය කරගත යුතු ණය ප්‍රමාණය රු.මිලියන 236.46 ක් වේ. නමුත් අධ්‍යක්ෂ සංවර්ධන විසින් ලබාදුන් වාර්තාවට අනුව 2017 දෙසැම්බර් 31 දිනට අයවී ඇති මුළු ණය ශේෂය රු.මිලියන 30.15 වේ. ඒ අනුව ණය අයකිරීමේ සාමාන්‍ය 2017/1/1 දිනට ලබා දුන් මුලු ණය වටිනාකමෙන් සියයට 7.45 ක් පමණි. ඒ අනුව ණය අයකිරිම නිසි අධීක්ෂණයකින් සිදු නොවීම නිසා ඉතා දුර්වල තත්ත්වයක පවතින බව නිරීක්ෂණය විය.

(iv) අමාත්‍යාංශය මඟින් ඉදිරිපත් කර ඇති මඟ පෙන්වීම අනුව නිවාස ඉදිකිරීම සඳහා ලබාදෙන ණය මුදල් සඳහා සියයට 4 ක පොළියක් අයකරන බව පළමු ඡේදයෙහි දක්වා ඇත. නමුත් එම පොළිය අයකිරීම අනුව, අංක 261/2017 හා 2017/12/21 දිනැති රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තු චක්‍රලේඛය අනුව රාජ්‍ය ආදායම් පිළිබඳ වාර්තාවක් හා හිඟ ආදායම් වාර්තාවක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොමැත.

**2.9 හානි පිළිබඳ වගකීම**

---------------------

අමාත්‍යාංශය වෙන් කරන ලද වාහනයක් සඳහා 2017 පෙබරවාරි 12 දින සිදුවූ මාර්ග අනතුරක් නිසා වාහනයේ අළුත් වැඩියා සම්බන්ධයෙන් රු 403,700 ක්ද දැරීමට සිදුවී තිබුණි. නමුත් රක්ෂණ ආයතනය 2017 දෙසැම්බර් 9 දින රු176,325 ක් පමණක් ලබාදීමට එකග වී තිබුණි. තවද මේ සම්බන්ධයෙන් 2017 පෙබරවාරි 20 දින ගම්පහ මහේස්ත්‍රාත් අධිකරණයේදී ලබා දී ඇති තීන්දුව ප්‍රකාරව රියදුරා රිය අනතුර වළක්වා ගැනීමට අවශ්‍ය කටයුතු නොකර නොසැලකිල්ලෙන් හා වාහනය නිසි පාලනයෙන් තොරව ධාවනය කිරීම මෙම අනතුරට හේතුවී ඇති බව දක්වා තිබුණි. නමුත් මේ සම්බන්ධයෙන් මු.රේ 104(4) ප්‍රකාරව අවසන් වාර්තාව සකස්කර, අනතුරෙන් වූ හානියට වගකිවයුතු පාර්ශවය හඳුනා ගැනීම හා අදාල අලාභ හානි අයකර ගැනීමට 2018 අප්‍රේල් 16 දින දක්වා සිදු කර නොතිබුණි.

**2.10 විසඳා නොතිබුණු විගණන ඡේද**

--------------------------------

අමාත්‍යාංශයට අදාළව විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබුණු විගණන ඡේදවලින් පෙන්වා දුන් ඌනතාවයන් සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් නිවැරදි කර නොතිබුණු ඡේදවලට යොමුව පහත දැක්වේ.

| විගණකාධිපති වාර්තාවට යොමුව | | යොමුගත විෂයය |
|---|---|---|
| **වර්ෂය** | **ඡේද අංකය** | |
| 2016 | 3.10 | 2016 අගෝස්තු 22 දින වෙන් කල වාහනයකට සිදුවූ අනතුර හේතුවෙන් එය අලුත්වැඩියා කිරීමට රු.මිලියන 1.03 ක වියදමක් වැයකර තිබුණි. නමුත් මෙම අනතුර සම්බන්ධව මු.රෙ. 103(1)(ආ) හදිසි අනතුරු සම්බන්ධයෙන් වූ විට පොලිසියට වාර්තා කළ යුතු වුවත් එසේ කර නොතිබු අතර මුදල් රෙගුලාසි 104(3) ප්‍රකාරව ප්‍රාරම්භක වාර්තාව, 2018 ජනවාරි 09 දින පිළියෙල කර ඇති නමුත්, තුන්වන පාර්ශවීය රක්ෂණය පමණක් සිදුකර ඇති මෙම වාහනයට වැයකිරීමට වන මුළු මුදලම රජයට සිදුවන අලාභයක් වන අතර එය අවම කර ගැනීමට හා වගකිවයුතු පාර්ශවය හඳුනා ගැනීමට 104(4) ප්‍රකාරව අවසන් වාර්තාව සකස්කර, අනතුරෙන් වූ හානියට වගකිවයුතු පාර්ශවය හඳුනා ගැනීම හා අදාල අලාභ හානි අයකර ගැනීමට 2018 අප්‍රේල් 16 දින දක්වා සිදු කර නොතිබුණි. |
| | | වැව්ලි මානව සංවර්ධන භාරය මගින් ඉටුකරනු ලබන ව්‍යාපෘති සඳහා අමාත්‍යාශය මගින් ගෙවීම් කිරීම හා පොත් පත් පවත්වා ගැනීම |
| 2016 | 3.7 (ඊ) (i) | ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීමේදී අමාත්‍යාංශය හා අනෙකුත් ආයතන අතර ගිවිසුම්ගතවී නොමැති අතර සියළුම ව්‍යාපෘති අධීක්ෂණය කරනු ලබන වැව්ලි මානව සංවර්ධන භාරය මගින් එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම වතු සමූපකාර සමිති වෙත ලබාදීමෙන් පසු ඔවුන් විසින් උප කොන්ත්‍රාත් ලබා දීම සිදු කර ඇති අතර ගෙවීම් කිරීමේදී අමාත්‍යාංශය සියලු චෙක්පත් සෘජුවම කොන්ත්‍රාත් කරුවන් හට ලබා නොදී වැව්ලි මානව සංවර්ධන භාරය නමින් ලියා ලබා දීම නිසා එම උප කොන්ත්‍රාත් ලාභීන් හට මුදල් ලැබීමේ පමාවක් හා වැව්ලි මානව සංවර්ධන භාරය මගින් එම මුදල් රඳවා ගැනීම මගින් අයථා මුදල් පරිහරණයක් හා ව්‍යාපෘතීන් ඉදිකිරීමේ ප්‍රමාදයක් විය හැකි බව විගණනයට නිරීක්ෂණය විය. |

| | | |
|---|---|---|
| 2016 | 3.7 (ඊ)(ii) | 2015 වර්ෂයේ විගණන නිරීක්ෂණ මඟින් ගිණුම් අංශය සෘජුවම සංවර්ධන අංශයේ නිලධාරීන්ට චෙක්පත් ලබාදෙන බවත්, ඒ පරිදි සංවර්ධන අංශය මගින් චෙක්පත් ලබා ගෙන නැවත තැපැලෙන් යැවීම හෝ අතින් භාර දීම සිදුකරණු ලබන්නේ නම් එම අංශය මගින් එසේ වැවිලි මානව සංවර්ධන භාරය වෙත නිකුත් කරනු ලැබූ සියළු චෙක්පත් සඳහා චෙක්පත ලියූ දිනය, චෙක්පත් අංකය, ඊට මුදල් ගෙවන බැංකුව, එය ලබන අය, වටිනාකම, වවුචර් අංකය, චෙක්පත යැවූ දිනය, එම මුදල් ලද බව දැනුම් දුන් දිනය හා යැවුම් භාර නිලධාරියාගේ කෙටි අත්සන ඇතුළත් ලේඛනයක් මුදල් රෙගුලාසි අංක 388 අනුව පවත්වාගෙන යා යුතු බව පසුගිය වර්ෂයේදීද පෙන්වා දුන් නමුත් සමාලෝචිත වර්ෂයේදීද සංවර්ධන අංශය මගින් වැවිලි මානව සංවර්ධන භාරය වෙත නිකුත් කරනු ලැබූ චෙක්පත් සඳහා ඉහත පරිදි ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| 2016 | 3.7 (ඊ) (iv) | ශ්‍රී ලංකා මුදල් රෙගුලාසි සංග්‍රහයේ 501 (ඇ) හා 502 (ආ) අනුව නිවාස ලාභීන්ට දෙන ණය මුදල්, හිමිකම්පෑම් වෙනුවෙන් කෙරෙන කොටස් ගෙවීම් ගිණුම්ගත කිරීම හා මුල් ගෙවීම සඳහා අධිකාර බලය දීමේදී නියම කරන ලද කොන්දේසි ප්‍රකාරව සම්පූර්ණ මුදලම ආපසු අයකර ගැනීම සහතිකවීම සඳහා ලැබිය යුතු මුදල් අප්‍රමාදව එකතු කර ගැනීමට අදාල කාර්යයෙහි සතුටුදායක ප්‍රගතියක් අත්කර ගැනීම සම්බන්ධයෙන් අදාල සියළුම ගණුදෙනු සටහන් කර තබා ගැනීමට පොත් පත් පවත්වා ගැනීමට කටයුතු කර නොතිබුණි. |

## 2.11 කළමනාකරණ දුර්වලතා

----------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) ඉදිකිරීම් හා පුහුණු සංවර්ධන ආයතනයේ නියමයන්ට අනුව දිනකට ප්‍රමාද ගාස්තුව කොන්ත්‍රාත් වටිනාකමින් 1/2000 ක් විය යුතු අතර, රැඳවුම් මුදල සියයට 10 ක් විය යුතුය. නමුත් එයට පටහැනිව නිවාස ඉදිකිරීමේ කොන්ත්‍රාත් ගිවිසුම්වල රැඳවුම් මුදල සියයට 2.5 ලෙසත්, ප්‍රමාද ගාස්තුව දිනකට රු.500 ක් ලෙසත් ගිවිසුම්ගත වී තිබුණි.කෙසේ වුවද, කොන්ත්‍රාත්තුව කොපමණ කාලයක් ප්‍රමාද වුවද, පරීක්ෂා කරන ලද ව්‍යාපෘති 78 සඳහාම ප්‍රමාද ගාස්තු අයකිරීමක් සඳඅකර නොතිබුණි.

(ආ) කොන්ත්‍රාත් සඳහා ගෙවීම් සම්බන්ධයෙන් නියැදියක් ලෙස 2017 වර්ෂයේ වවුචර් පරීක්ෂා කිරීමේදී ඒ සමග නිකුත් කරන ලද සමහර චෙක්පත් සඳහා ඒවා ලද බවට මුදල් රෙගුලාසි 264 ප්‍රකාරව වැවිලි මානව සංවර්ධන භාරයෙන් රිසිට් පත් ලැබී නොතිබුණි.

(ඇ) රාජ්‍ය විගණන අංශය විසින් 2017 වර්ෂය සඳහා විගණන විමසුම් 12 නිකුත් කර ඇති නමුත් ඉන් විගණන විමසුම් 9 ක් සඳහා මාස 2ක් සිට මාස 1ක් දක්වා ප්‍රමාද වී ඇතත් 2018 සැප්තැම්බර් 10 දින වන විටත් පිළිතුරු ලබා දී නොතිබුණි.

**2.12 මහජනයා වෙත සේවා ඉටු කිරීම**

**----------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) මහජන පැමිණිලි භාර ගැනීම**

**----------------------------------**

අමාත්‍යාංශය සඳහා වෙබ් අඩවියක් නිර්මාණය ඇති නමුත් එමගින් මහජනයාගෙන් පැමිණි ලබා ගැනීමේ ක්‍රමවේදයක් පිළියෙල කර නොමැති බව හා ලේඛණයක් නොමැති බව නිරීක්ෂණය විය.

**(ආ)** නිවාස ව්‍යාපෘති ඉටු කිරීමේදී දරිද්‍රතාවයෙන් පෙලෙන නිවසක හිමිකාරිත්වයක් නොමැති අත්‍යාවශ්‍ය පුද්ගලයන්ට මෙම නිවාස නොලැබෙන බවත්, තෝරා ගැනීමේ නිසි ක්‍රමවේදයක් නොවන බවටත් මහජන නියෝජන ලැබී ඇත. නිවාස ලාභීන් තෝරනු ලබන ක්‍රමවේදයක් අමාත්‍යාංශය සතු නොවන බැවින් හා වතු කළමණාකරණය හා වැවිලි මානව සංවර්ධන භාරය වැනි භාහිර ආයතන විසින් නිවාස ලාභීන් විනිවිද භාවයෙන් තොරව තීරණය කරනු ලබන බැවින් අක්‍රමිකතා සිදු විය හැකි බව විගණනයේදීද නිරීක්ෂණය විය.

(ඇ) කොටියගල නිවාස 140ක් ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව ප්‍රධානය කල 2016 මැයි 23 දිනෙන්ද පසුව එනම් 2016 ජූනි 08 දින මෙම ව්‍යාපෘතිය සඳහා නිවාස ඉදිකිරීමේදී ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ නායයෑම් පර්යේෂණ හා අවදානම් කළමණාකරන අංශය මඟින් අදාල වාර්තාව ලබා ගැනීම හේතුවෙන් එම ලබාදුන් නිර්දේශයන් පිළිබඳව සැලකිලිමත්ව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග පිලිවිතරය සඳහා ඇතුලත්කර ක්‍රියාත්මක කර ඒවා අනුගමනය කර නොමැති බව හා නිවාස භාවිතා නොකිරීම මෙම ව්‍යාපෘතිය 2017 නොවැම්බර් 26 දින භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ පහත කරුණු අනුව තහවුරු විය.

(i) නිවාස ඉදිකළ ඉඩම් දැඩි බෑවුම් සහිත ඉඩමක් වූ අතර වැසි ජලය ගලා යාම නිසා නිවාස ඉදිකළ භූමිය දැඩි පාංශු ඛාදනයකට ලක්වී තිබූ අතර ඇතැම් නිවාස වල පැවැත්මට එය දැඩි තර්ජනයක් බව දිස්විය. ප්‍රවේශ මාර්ගයද නිමවා නොතිබුණි.

(ii) නිවාස සඳහා විදුලිය හා ජල පහසුකම් ලබා නොදීම නිසා යතුරු භාර දී ඇතත් කිසිවෙකු නිවාසවල පදිංචි වී නොතිබුණි.

(ඈ) අමාත්‍යාංශ ලේකම් විසින් 2017 ජනවාරි 20 දින ඉහත ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්කරු වෙත මේ දක්වා එක් නිවසක්වත් නිම කර භාරදී නොමැති බවත් ජේෂ්ඨ කාර්මික නිලධාරියෙක් එදින සිට ඉකුත් මාස 6 ක් තුල වැඩ බිම සඳහා පත් කර නොමැතිව තිබුණ බවත්, පොරොන්දු වූ පරිදි එදින දක්වා ඉංජිනේරුවෙක්ද පත් කර නොතිබුණ බවත් කාර්යසාධනය ඉතා දුර්වල මට්ටමේ පෙන්නුම් කර ඇති බවද සඳහන් කර තිබුණි. නමුත් මුල් ගිවිසුමේ නියමයන්ට අනුකූලව නියමිත පරිදි නිම නොකර තිබියදී සාධාරණත්වයක් නොමැති හේතුන් දක්වා විටින් විට ගිවසුමේ කාලය දීර්ඝ කර ගෙන තිබුණි.

(ඉ) තවද 2017 අගෝස්තු 15 දිනැති කොටියාල වතු නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීගේ ලිපිය පරිදි නිවාස184 කින් 42ක් පමණක් නිම කර ඇති බව හා ඉතිරි නිවාස ඉදිකිරීමට අවශ්‍ය ඉඩම හඳුනාගෙන ඇති නමුත් 2017 ජූනි මාසයෙන් පසුව කොන්ත්‍රාත්කරු ව්‍යාපෘතිය අතරමග නතර කර ඇති බවත් වැවිලි මානව සංවර්ධන භාරයේ නිළධාරීන් හෝ අමාත්‍යාංශයේ නිළධාරීන් කොන්ත්‍රාත් වැඩබිම අධීක්ෂණයට පැමිණ නොතිබුණු බවත් දක්වා තිබුණි. 2017 නොවැම්බර් 26 දින විගණනය විසින් සිදුකල භෞතික පරීක්ෂාවේදී ඉහත තත්ත්වය සනාථ වී තිබුණි.

**2.13 තේ වගා කිරීම සඳහා පවතින ඉඩම් ප්‍රමාණය දීර්ඝකාලීනව අඩු වී යා හැකි බව**

අංක අමප/15/0364/612/012 දරන 2015 අප්‍රේල් 23 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව වතු සේවකයන්ට ඉඩම් අයිතිය සමඟ සැබෑ නිවසක හිමිකාරීත්වය ලබා දීම සඳහා ප්‍රතිපත්තිමය වශයෙන් අනුමැතිය ලබා දීමට කටයුතු කර ඇත. ඒ අනුව වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය මගින් අදාළ ප්‍රතිලාභියාට පර්චස් 07 ක ඉඩමක හා නිවසක අයිතිය නීත්‍යානුකූලව ලබා දීමට තීරණය කර ඇත. නමුත් වතු සේවකයන් නොවන වෙනත් රැකියාවල නිරත පුද්ගලයන් ද ප්‍රතිලාභීන් ලෙස තෝරා ගෙන තිබුණි. ඒ අනුව මෙම ප්‍රතිලාභීන් ගෙන් වතුයායේ වැඩකරන සංඛ්‍යාව සියයට 28 ක් වැනි අඩු ප්‍රමාණයක් වන බව විගණන පරීක්ෂාවලදී අනාවරණය විය.

**2.14 කාර්යභාරයන් ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරීම**

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 05 ක කාලය තුළ අමාත්‍යාංශයට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු හා ඒ පිළිබඳ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 2013 | පුනරාවර්තන | 189.28 | 188.93 | 0.35 | 0.18 |
| | මූලධන | 152.06 | 135.24 | 16.82 | 11.06 |
| | **එකතුව** | **341.34** | **324.17** | **17.17** | **5.19** |
| 2014 | පුනරාවර්තන | 390.33 | 388.04 | 2.29 | 0.59 |
| | මූලධන | 4,441.57 | 4,301.16 | 140.41 | 3.16 |
| | **එකතුව** | **4,831.9** | **4,689.2** | **142.7** | **2.95** |
| 2015 | පුනරාවර්තන | 322.03 | 271.08 | 50.95 | 15.7 |
| | මූලධන | 824.44 | 785.80 | 38.64 | 4.7 |
| | **එකතුව** | **1,146.47** | **1,056.88** | **89.59** | **7.8** |
| 2016 | පුනරාවර්තන | 223.42 | 189.12 | 34.30 | 15 |
| | මූලධන | 1,573.58 | 1,094.97 | 478.61 | 30 |
| | **එකතුව** | **1,797.00** | **1,284.09** | **512.91** | **29** |
| 2017 | පුනරාවර්තන | 335.38 | 308.48 | 26.89 | 8 |
| | මූලධන | 4,032.51 | 2,116.24 | 1,916.27 | 47 |
| | **එකතුව** | **4,367.89** | **2,424.73** | **1,943.16** | **44** |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**විසර්ජන ගිණුම**

**(i) සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම**

වැය විෂයයන් 2 ක් සඳහා සලසා තිබුණු රු. 132.02 මිලියන මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් කිසිදු උපයෝජනයක් නොකර මුළුමණින්ම ඉතිරි කර තිබුණි.

**(ii)** **අධි ප්‍රතිපාදන සලසා තිබීම**

වැය විෂයයන් 9 ක් සඳහා එකතුව රු.මිලියන 951.66 ක අධි ප්‍රතිපාදන සලසා තිබීම නිසා එම වැය විෂයයන්ට අදාළ ප්‍රතිපාදනවලින් එකතුව රු.මිලියන 559.84 පමණක් උපයෝජනය කිරීම නිසා ඉතිරිය සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 11 ක සිට සියයට 89 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

**(iii)** **පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරීම් මගින් ප්‍රතිපාදන සලසා ගැනීම**

වැය විෂයයන් 11ක රු.මිලියන 21.15 ප්‍රතිපාදනයෙන් රු.මිලියන 7.85 ක් මුදල් රෙගුලාසි 66 යටතේ වෙනත් වැය විෂයයන්ට මාරු කර තිබුණි. එය එම වැය විෂයයන් 11 ට වෙන්කර තිබූ ප්‍රතිපාදනයෙන් සියයට 11සිට සියයට 100 ක් විය. ඒ අනුව අවශ්‍ය ප්‍රමාණයට වඩා ප්‍රතිපාදන සලසාගෙන ඇති බව නිරීක්ෂණය විය.

## 2.15 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

**(අ)** **පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශයට අදාල විෂය අංක 140011 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| **වියදම** | | **ලැබීම්** | | **හර ශේෂය** | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 14.00 | 13.94 | 7.00 | 7.09 | 40.00 | 27.98 |

**(ආ)** **හිඟ හිටි ණය ශේෂ අයකර නොගැනීම**

විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව ස්ථාන මාරුවී ගිය නිලධාරීන්ගේ ණය ශේෂ හැර රු.478,625 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 01 ක සිට වර්ෂ 03 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, එම හිඟ හිටි ණය ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවැතුණි.

## 2.16 අග්‍රිම ගිණුම

අමාත්‍යාංශය විසින් පවත්වා තිබුණු අග්‍රිම ගිණුම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා අමාත්‍යාංශය විසින් පිළියෙල කර තිබුණු අග්‍රිම ඇස්තමේන්තුව අනුව මාසික ලබා ගැනිමට අපේක්ෂා කළ අග්‍රිමයන්, මාසික ඉල්ලුම්කළ අග්‍රිමයන් හා ලැබී තිබුණු අග්‍රිමයන් පිළිබඳ විස්තර පහත දක්වා ඇත.

| මාසය | සැලැසුම් කළ පරිදි ඉල්ලුම් කළ යුතු අග්‍රිමය | ඉල්ලුම් කළ අග්‍රිමය | ලැබී තිබුණු අග්‍රිමය | සැලැසුම් කළ පරිදි ඉල්ලුම් කළ අග්‍රිමය අතර වෙනස | ඉල්ලුම් කළ අග්‍රිමය හා ලැබී තිබුණු අග්‍රිමය අතර වෙනස |
|---|---|---|---|---|---|
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| ජනවාරි | 276.14 | 127.00 | 77.8 | 149.14 | 49.2 |
| පෙබරවාරි | 328.33 | 65.00 | 18.97 | 263.33 | 46.03 |
| මාර්තු | 328.64 | 100.00 | 18.97 | 228.64 | 81.03 |
| අප්‍රේල් | 376.87 | 100.00 | 73.27 | 276.87 | 26.73 |
| මැයි | 326.86 | 125.00 | 100.21 | 201.86 | 24.79 |
| ජුනි | 285.42 | 160.00 | 131.1 | 125.42 | 28.9 |
| ජුලි | 292.4 | 500.00 | 219.1 | (207.60) | 280.9 |
| අගෝස්තු | 276.74 | 200.00 | 136.37 | 76.74 | 63.63 |
| සැප්තැම්බර් | 276.85 | 375.00 | 231.2 | (98.15) | 143.8 |
| ඔක්තෝබර් | 280.23 | 610.00 | 219.1 | (329.77) | 390.9 |
| නොවැම්බර් | 275.77 | 610.00 | 293.94 | (334.23) | 316.06 |
| දෙසැම්බර් | 39.41 | 800.00 | 381.04 | (760.59) | 418.96 |
| එකතුව | 3,363.66 | 3,772.00 | 1,901.07 | (408.34) | 1,870.93 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

අමාත්‍යාංශයෙන් විගණන විමසුම සඳහා ලද පිළිතුරට අනුව ප්‍රතිපාදන ඉතිරිවීමට හේතුව ලෙස ඉල්ලු අක්මුදල් නොලැබීම දක්වා ඇත. ඒ අනුව 2017 වර්ෂය තුළ මූලධන වියදම් සඳහා ඉල්ලු අක්මුදල් වලින් රු.මිලියන 1,871 ක් එනම් සියයට 50 ලැබී නොමැත. තවද එම මූලධන වියදම් සඳහා ඉල්ලු අක්මුදල් වලින් රු. මිලියන 2020 ක් එනම් සියයට 53 ක් ම ඉල්ලුම් කර ඇත්තේ අවසන් මාස 3 තුල දී බව නිරීක්ෂණය විය.

## 2.17 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර ,ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බැව් නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|
| බැරකම් පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 214/447(4,5) | එක් එක් මාසය අවසානයේ ඉතිරි බැරකම් හා විලම්භණය කරන ලද බැරකම්ද හඳුනාගත නොහැකි ආකාරයට අසම්පූර්ණ බැරකම් පිළිබඳ ලේඛනයක් පවත්වා තිබුණි. |
| ඇප ලේඛණය | මුදල් රෙගුලාසි 891 | ඇප ලේඛණයක් අමාත්‍යාංශය විසින් නඩත්තු නොකරන බව නිරීක්ෂණය විය. |

**2.18 අනුකූල නොවීම්**

**-----------------**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි අංක 702 (3) ප්‍රකාරව අමාත්‍යාංශය විසින් අත්සන් කරන ලද සියළුම කොන්ත්‍රාත්තු පිටපත් තුනකින් අත්සන් කර ඉන් එක් පිටපතක් විගණකාධිකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වුවත් එසේ සිදු කර නොතිබුණි.

**2.19 අභ්‍යන්තර විගණනය**

------------------------

ගණන්දීමේ නිලධාරීන් විසින් තම දෙපාර්තමේන්තුවල මුදල් රෙගුලාසි 128 හි දක්වා ඇති ස්වකීය රාජකාරී හා වගකීම් ඉටු කිරීම සඳහා තම දෙපාර්තමේන්තුවල අභ්‍යන්තර විගණන ඒකක පිහිටුවා ගත යුතුව බව මුදල් රෙගුලාසි 133 මගින් අවධාරණය කර ඇත. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අභ්‍යන්තර විගණන ඒකකය ප්‍රධාන අභ්‍යන්තර විගණක ඇතුළු නිලධාරීන් තිදෙනෙකුගෙන් පමණක් සමන්විත වූ අතර 2009 ජුනි 09 දිනැති ඩීඑම්ජී/2009/01 අංක දරන කළමනාකරණ විගණන දෙපර්තමේන්තුවේ චක්‍රලේඛය පරිදි අභ්‍යන්තර විගණන අංශය ශක්තිමත් කිරීමට ගිණුම් හා විගණනය පිළිබඳ දැනුම පුහුණුව ඇති ප්‍රමාණවත් නිලධාරීන් ශාඛාවට අනුයුක්ත කර නොතිබුණි.

(ආ) 2016 මාර්තු 24, 2016 නොවැම්බර් 09 දින හා 2016 දෙසැම්බර් 16 යන දිනයන්හි නිකුත් කල අභ්‍යන්තර විගණන විමසුම් තුනක් සඳහා 2018 ජූලි 25 දින වන විටත් සඳහා පිළිතුරු ලබාදී නොතිබුණි.

(ඇ) 2017 වර්ෂය වෙනුවෙන් 2017 මාර්තු 20 දින සිට 2017 දෙසැම්බර් 15 දක්වා අභ්‍යන්තර විගණන විමසුම් 31 ක් නිකුත් කර ඇති අතර 2018 ජූලි 25 දින වන විටත් විමසුම් 12 ක් සඳහා පිළිතුරු ලබාදී නොතිබුණි.

**2.20 මානව සම්පත් කළමනාකරණය**

**----------------------------------**

**2.20.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම**

**------------------------------------------------------------------------------------------**

අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සඳහා 2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය, පුරප්පාඩු හා අතිරික්ත කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අමාත්‍යාංශය විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු. මිලියන 209.64 ක් වැය කර තිබුණි. ඒ අනුව ඒක පුද්ගල වියදම රු. 866,275ක් වී තිබුණි.

| | සේවක වර්ගය | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 16 | 12 | 04 | - |
| (ii) | තෘතියික මට්ටම | 04 | 01 | 03 | - |
| (iii) | ද්විතියික මට්ටම | 295 | 207 | 88 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 27 | 21 | 06 | - |
| (v) | අනියම්/කොන්ත්‍රාත් | - | 01 | - | 01 |
| | එකතුව | 342 | 242 | 101 | 01 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) අවශ්‍යතාවය ඉක්මවා කාර්ය මණ්ඩලය අනුමත කරවා ගැනීම**

(i) ඉහත පුරප්පාඩු තුල කළමනාකාර සහකාර තනතුරු 20 කින් 8ක්ද කාර්යාල කාර්ය සහායක තනතුරු 12 කින් 5 ක්ද පැවතීම නිරීක්ෂණය විය.

(ii) 2018 වර්ෂයට අදාල වාර්ෂික අය වැය ඇස්තමේන්තුවෙහි සඳහන් වැටුප් ඇස්තමේන්තුව පිළියෙල කිරීමේදී 2017 අමාත්‍යාංශයේ සත්‍ය සේවා නියුක්ති විස්තර පදනම් කරගෙන ඇති බවට සඳහන් කර ඇත. නමුත් 2017 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයට අදාළව අනුමත කර ඇති කාර්යමණ්ඩලය හා තත්‍ය සේවක සංඛ්‍යාව අනුව වාර්ෂික අය වැය ඇස්තමේන්තුවෙහි අනුමත සංඛ්‍යාව 297 කින් හා තත්‍ය සේවක සංඛ්‍යාව 92 කින් වැඩි බව නිරීක්ෂණය විය.

(iii) ඉහත කාර්ය මණ්ඩලය තුල ඇතුලත් නොවූ 2016 ජූනි 29 දින අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව පවරා ගනු ලැබූ පූල් බැංක් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, රම්බොඩ සංස්කෘතික මධ්‍යස්ථානය, නෝර්වුඩ් ක්‍රීඩා සංකීර්ණය හා ප්‍රජා ශක්ති මධ්‍යස්ථානය යන ආයතන හතරේ සේවකයින් 185 කටද ඉහත අනුමැතිය තුල සඳහන් නොවූ සෞම්‍යමූර්ති තොණ්ඩමාන් අනුස්මරණ පදනමේ (ප්‍රධාන කාර්යාලය) කාර්ය මණ්ඩලය 15 ක් සඳහා ද අමාත්‍යාංශය විසින් 1409 (වෙනත්) වැය ශීර්ෂය යටතේ වැටුප් ගෙවා ඇති බව නිරීක්ෂණය විය.
විස්තර පහත දැක්වේ.

| | සේවක වර්ගය | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව |
|---|---|---|---|
| (i) | පූල් බැන්ක් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය | 56 * | 35 |
| (ii) | රම්බොඩ සංස්කෘතික මධ්‍යස්ථානය | 10 | 11 |
| (iii) | නෝර්වුඩ් ක්‍රීඩා සංකීර්ණය | 35 | 5 |
| (iv) | ප්‍රජා ශක්ති මධ්‍යස්ථානය - ස්ථිර | - | 102 |
| | -කොන්ත්‍රාත් | 158 | 32 |
| (v) | තොණ්ඩමාන් අනුස්මරණ පදනම | 29 | 15 |
| | එකතුව | 288 | 200 |

අ

නුමත කාර්යය මණ්ඩලය විගණනයට ඉදිරිපත් නොවූ අතර ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

* සෞම්‍යමූර්ති තොණ්ඩමන් අනුස්මරණ පදනම යටතේ පවතින අමාත්‍යාංශයට පවරාගත් පූල් බැංක් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයට අදාළ කාර්ය මණ්ඩලය කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව හෝ වෙනත් ආයතනයක් මඟින් අනුමත කර නොමැති බව නිරීක්ෂණය විය.

* මෙම අමාත්‍යාංශය යටතේ සේවයේ යෙදෙන වැවිලි ප්‍රජා සන්නිවේදන පහසුකම් සපයන්නා අනුමත සංඛ්‍යාව 255ක් වන අතර වර්තමානයේ 179 සිටින අතර ඔවුන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට ද ප්‍රාදේශීයව පවතින නිවාස භාර අරමුදල් වලට ද අනුයුක්ත කර ඇති අතර එම නිවාස භාර අරමුදල් යටතේ සිදුකරනු ලබන ව්‍යාපෘති අධීක්ෂණ කටයුතු සඳහා ඔවුන්ට රාජකාරි ලැයිස්තු ලබාදී තිබුණද, එම කරුණු ඉටුකිරීමට ඔවුන්ට අවස්ථාවක් ලැබී නොමැති බව ඔවුන්ගේ ප්‍රකාශ අනුව තහවුරු විය. තවද ඔවුන් ගේ අධීක්ෂණ වාර්තා කොන්ත්‍රාත් ගෙවීම් සඳහා ඉදිරිපත් කල යුතු බවට ඔවුන් වෙත රාජකාරී පැවරීමේදී දක්වා තිබුණද, ඒවා සැලකිල්ලට නොගෙන අමාත්‍යාංශය ගෙවීම් කිරීම සිදුකර තිබූ අතර ඔවුන් ඵලදායීව කාර්යසාධනයට යොදවා ගෙන නොමැති බව නිරීක්ෂණය විය.

**(ආ) කාර්ය මණ්ඩලය පුහුණු කිරීම**

**-------------------------------**

කාර්ය මණ්ඩලය නිතිපතා පුහුණු කිරීමේ අවශ්‍යතාවක් ඇති බැවින් අමාත්‍යාංශය විසින් එහි කාර්ය මණ්ඩලය පුහුණු කිරීම පිළිබඳ ඉදිරිපත් කර ඇති විස්තර අනුව,

(i) අවම වශයෙන් වර්ෂයකට පැය 08 ක හෝ පුහුණුවක් නොලැබූ සංඛ්‍යාව 34 ක් විය.

(ii) පසුගිය වර්ෂ 5 තුළ පුහුණු කිරීම් කටයුතු සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කර තිබුණු ප්‍රමාණය සසඳා බැලීමේදී 2015 වර්ෂය හැර අනෙකුත් වර්ෂ වල ප්‍රතිපාදන සියයට 98 උපයෝජනය කර ඇති බව නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| වර්ෂය | ශුද්ධ ප්‍රතිපාදනය | වියදම | ඉතිරිය | ප්‍රතිපාදන උපයෝජනය ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | |
| 2013 | 710,000 | 698,640 | 11,360 | 98.4 |
| 2014 | 3,520,000 | 3,508,859 | 11,141 | 99.68 |
| 2015 | 1,560,000 | 988,436 | 571,564 | 63.36 |
| 2016 | 1,000,000 | 997,876 | 2,124.00 | 99.79 |
| 2017 | 900,000 | 896,684 | 3,316 | 99.63 |

## 2.21 රජයේ නිලධාරීන් ඇප තැබීම

**-------------------------------**

මුදල් රෙගුලාසි 880 සඳහන් විධිවිධාන ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන් විසින් ඇප තබා ඇත් ද යන්න තහවුරු කර ගැනීම සඳහා ඇප ලේඛණයක් අමාත්‍යාංශය විසින් නඩත්තු කර නොතිබුණි.